# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1980 අංක 35 දරන සංවර්ධන
# සභා පනත

[සහතිකය සටහන් කළේ 1980 සැප්තැම්බර් මස 22 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1980 ඔක්තෝබර් මස 03 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

මිළ : රු. 2.40 යි

තැපැල් ගාස්තුව : රු. 1.50 යි.

# 1980 අංක 35 දරන සංවර්ධන සභා පනත

[සහතිකය සටහන් කළේ 1980 සැප්තැම්බර් මස 22 වන දින]

එල්. ඩී.—ඕ. 28/80

සංවර්ධනය කඩිනම් කිරීමේ කාර්ය සඳහා වූ සංවර්ධන සභා සංස්ථාපනය කිරීම සම්බන්ධයෙන් සහ ඒවායේ සංයුතිය සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද ඒ සභාවල බලතල, කාර්ය සහ කර්තව්‍ය නිශ්චිතව දැක්වීම පිණිස ද, සංවර්ධන සභාවල විධායක කමිටු සංස්ථාපනය කිරීම සඳහා සහ ඒවායේ සංයුතිය සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද, ඒ කමිටුවල බලතල, කාර්ය සහ කර්තව්‍ය නිශ්චිතව දැක්වීම පිණිස ද ඒ සභාවලට සහ කමිටුවලට අදාළව දිසා අමාත්‍යවරයන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය නිශ්චිතව දැක්වීම පිණිස ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික සියලු කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1980 අංක 35 දරන සංවර්ධන සභා පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. (ලුහුඬු නාමය.)

## I වන කොටස

### සංවර්ධන සභා සංස්ථාපනය කිරීම සහ ඒවායේ සංයුතිය

2. (1) ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් ජනාධිපතිවරයා විසින්— (සංවර්ධන සභා සංස්ථාපනය කිරීම.)

(අ) එක් එක් පරිපාලන දිස්ත්‍රික්කය සඳහා සංවර්ධන සභාවක් සංස්ථාපනය කරනු ලැබිය යුතු ය :

එසේ වුව ද පරිපාලන දිස්ත්‍රික්ක එකකින් හෝ වැඩි ගණනකින් හෝ ඒවායේ යම් කොටස්වලින් හෝ ඒවායේ යම් සංයෝජනයකින් හෝ මැතිවරණ කොට්ඨාසයක් සංයුක්ත වන අවස්ථාවක, ඒ මැතිවරණ කොට්ඨාසය සඳහා ජනාධිපතිවරයා විසින් සංවර්ධන සභාවක් සංස්ථාපනය කරනු ලැබිය හැකි අතර, මේ පනතේ පරිපාලන දිස්ත්‍රික්කයක් සම්බන්ධයෙන් වූ සෑම සඳහන් කිරීමකට ම එවැනි මැතිවරණ කොට්ඨාසයක් සම්බන්ධයෙන් වූ සඳහන් කිරීමක් ද ඇතුළත් වන ලෙස සලකනු ලැබිය යුතු ය ;

(ආ) එසේ සංස්ථාපනය කරන ලද සංවර්ධන සභාවට නමක් දිය යුතු ය ;

(ඇ) එසේ සංස්ථාපනය කරන ලද සභාව සමන්විත විය යුතු තෝරා පත් කර ගන්නා ලද සභික සංඛ්‍යාව නියම කළ යුතු ය. එසේ නියම කරනු ලැබූ සංඛ්‍යාව, ඒ සභාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පරිපාලන දිස්ත්‍රික්කයක් සඳහා ද ඒ පරිපාලන දිස්ත්‍රික්කය සඳහා තෝරා පත් කර ගන්නා ලද පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් සංඛ්‍යාවට අඩු විය යුතු ය :

එසේ වුව ද පරිපාලන දිස්ත්‍රික්කය සඳහා තෝරා පත් කර ගන්නා ලද පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් සංඛ්‍යාව තුන් දෙනකුට අඩු වන අවස්ථාවක, ඒ පරිපාලන දිස්ත්‍රික්කය සඳහා තෝරා

2—ඒ 50686—13.500 (80/08)

පත් කර ගන්නා ලද පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් සංඛ්‍යාව සමග ගත් කළ සභික සංඛ්‍යාව පස්දෙනකුට අඩු නොවන පරිදි වූ යම් සභික සංඛ්‍යාවක් ජනාධිපතිවරයා විසින් නියම කරනු ලැබිය යුතු අතර, ඒ කාර්යය සඳහා, ඒ පරිපාලන දිස්ත්‍රික්කය සඳහා තෝරා පත් කර ගන්නා ලද පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් සංඛ්‍යාව ඉක්මවිය හැකි සභික සංඛ්‍යාව ජනාධිපතිවරයා විසින් නියම කරනු ලැබිය හැකි ය.

(2) (අ) (1) වන උපවගන්තිය යටතේ සංස්ථාපනය කරන ලද සෑම සංවර්ධන සභාවක් ම අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර, මේ පනතේ විධිවිධානවලට යටත්ව දේපළ අත් කර ගැනීමට, දැරීමට සහ විකිණීමට එයට බලය තිබිය යුතු ය. තව ද ඒ සභාව සංස්ථාපනය කරන ලද නියමය මගින් සභාවට දෙන ලද නාමයෙන් සභාව විසින් නඩු පැවරීම ද සභාවට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කළ හැකි ය.

(ආ) සංවර්ධන සභාවේ පොදු මුද්‍රාව දිසා ලේකම්වරයා භාරයෙහි තිබිය යුතු අතර, දිසා අමාත්‍යවරයා හෝ සභාවේ සභාපතිවරයා සහ දිසා ලේකම්වරයා ඉදිරිපිට දී හැර, ඒ මුද්‍රාව යම් ගිවිසුමකට හෝ වෙනත් සාධන පත්‍රයකට සභාව වෙනුවෙන් තබනු නොලැබිය යුතු ය. තව ද තමන් පැමිණ සිටි බවට සාක්ෂියක් වශයෙන් ඔවුන් ඒ ගිවිසුමට හෝ වෙනත් සාධන පත්‍රයට තම නම් අත්සන් කළ යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සංස්ථාපනය කරන ලද සංවර්ධන සභාවක කිසිම ක්‍රියාවක් හෝ කටයුත්තක්, එහි සභිකයන් අතර පුරප්පාඩුවක් තිබීමේ හෝ එහි සභිකයකු තෝරා පත්කර ගැනීමෙහි ලා යම් දෝෂයක් තිබීමේ හෝ හේතුවෙන් ම පමණක් අවලංගු වෙතැයි සලකනු නොලැබිය යුතු ය.

සංවර්ධන සභාවක සංයුතිය.

3. (1) සංවර්ධන සභාවක්—

(අ) ඒ සභාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පරිපාලන දිස්ත්‍රික්කයක් සඳහා ද ඒ එක් එක් පරිපාලන දිස්ත්‍රික්කය සඳහා වූ (මෙහි මින් මතු '' නිලබලයෙන් පත් වූ සභිකයන් '' යනුවෙන් සඳහන් කරනු ලබන) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගෙන් ; සහ

(ආ) ඒ සභාව, සංස්ථාපනය කරනු ලබන 2 වන වගන්තිය යටතේ වූ නියමයෙහි නියම කර ඇති (මෙහි මින් මතු '' තෝරා පත් කර ගන්නා ලද සභිකයන් '' යනුවෙන් සඳහන් කරනු ලබන) තෝරා පත් කර ගන්නා ලද සභිකයන් යම් සංඛ්‍යාවකින්

සමන්විත විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන්ව ඇත ද, අග්‍රාමාත්‍යවරයා හෝ පළාත් පාලන විෂයය භාර අමාත්‍යවරයා හෝ තෝරා පත් කර ගනු ලැබුවේ යම් මැතිවරණ කොට්ඨාසයක් සඳහා ද ඒ මැතිවරණ කොට්ඨාසය ඇතුළත පිහිටි යම් පරිපාලන දිස්ත්‍රික්කයක් සඳහා සංස්ථාපනය කරනු ලබන සංවර්ධන සභාවෙහි අග්‍රාමාත්‍යවරයා හෝ පළාත් පාලන විෂයය භාර අමාත්‍යවරයා සභිකයකු නොවිය යුතු ය.

(3) ජනාධිපතිවරයා විසින්—

(අ) අග්‍රාමාත්‍යවරයා ; සහ

(ආ) පළාත් පාලන විෂයය භාර අමාත්‍යවරයා

වෙනුවට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබීමට සුදුසුකම් ඇති යම් තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය :

එසේ වුව ද අග්‍රාමාත්‍යවරයා පළාත් පාලන විෂයය භාර අමාත්‍යවරයා වන අවස්ථාවක, එවැනි එක් තැනැත්තකු පමණක් පත් කරනු ලැබිය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ පත් කරන ලද යම් තැනැත්තකු ජනාධිපතිවරයාගේ ප්‍රසාදය ඇති තාක් ස්වකීය ධුරය දරන්නේ ය.

## II වන කොටස

### සංවර්ධන සභාවල සභිකයන්ගේ ධුර කාලය

4. (1) සංවර්ධන සභාවක තෝරා පත් කර ගන්නා ලද සභිකයන්ගේ ධුර කාලය තෝරා පත් කර ගන්නා ලද දිනයෙහි සිට අවුරුදු හතරක් විය යුතු ය : *සංවර්ධන සභාවක තෝරා පත් කර ගන්නා ලද සභිකයන්ගේ ධුර කාලය.*

එසේ වුව ද, සංවර්ධන සභාවක තෝරා පත් කර ගන්නා ලද සභිකයන්ගේ ධුර කාලය අවසන් විමට පෙර ඡන්ද විමසීමක් පවත්වනු ලැබූ අවස්ථාවක, ඒ ඡන්ද විමසීමේ දී තෝරා පත් කර ගන්නා ලද සභිකයන්ගේ ධුර කාලය, මුලින් සඳහන් කළ සභිකයන්ගේ ධුර කාලය අවසන් වූ දිනයට ඉක්බිතිව ම එළඹෙන දිනයෙහි ආරම්භ විය යුතු ය.

(2) මියගිය, ඉල්ලා අස් වූ හෝ අන්‍යාකාරයකින් ධුරය හිස් කළ සංවර්ධන සභාවක තෝරා පත් කර ගන්නා ලද සභිකයකු වෙනුවට සභිකයකු තෝරා පත් කර ගනු ලැබූ අවස්ථාවක, ඒ සභිකයා මේ පනතේ විධිවිධානවලට යටත්ව, ඔහුගේ පූර්වගාමියාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලසීමාව සඳහා ධුරය දැරිය යුතු ය.

(3) ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින්, අමාත්‍යවරයා විසින් සංවර්ධන සභාවක තෝරා පත් කර ගන්නා ලද සභිකයන්ගේ ධුර කාලය එක් අවුරුද්දක කාලයකින් දීර්ඝ කරනු ලැබිය හැකි ය.

සංවර්ධන සභාවක සභිකයන් ධුර දැරීම නතර වූ විට, විධායක කමිටුව විසින් හෝ දිසා අමාත්‍යවරයා විසින් බලතල ආදිය ක්‍රියාත්මක කළ යුතු බව.

5. (1) සංවර්ධන සභාවක තෝරා පත් කර ගන්නා ලද සභිකයන්ගේ ධුර කාලය අවසන් වන දිනයෙන් ආරම්භව සභාවේ ඊළඟට තෝරා පත් කර ගන්නා ලද සභිකයන්ගේ ධුර කාලය ආරම්භ වන දිනය තෙක් වූ කාලය ඇතුළත සංවර්ධන සභාවක විධායක කමිටුව විසින් හෝ ඒ විධායක කමිටුව විසුරුවා හරිනු ලැබූ අවස්ථාවක, දිසා අමාත්‍යවරයා විසින්, ඒ සභාවේ බලතල ක්‍රියාත්මක කිරීම සහ කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීම කළ යුතු ය. තව ද, ඒ අනුව සංවර්ධන සභාවක වෙනත් කිසිම සභිකයකු විසින් ඒ කාලසීමාව තුළ ඒ බලතල ක්‍රියාත්මක කිරීම සහ කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීම නොකළ යුතු ය.

(2) පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබූ විට, සංවර්ධන සභාවක නිල බලයෙන් පත් වූ සභිකයන් විසින් කර්තව්‍ය ඉටු කිරීම නතර විය යුතු අතර, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තෝරා පත් කර ගැනීම සඳහා වූ මහ මැතිවරණය අවසන් වන තෙක් ඒ සභාවේ විධායක කමිටුව විසින් හෝ ඒ විධායක කමිටුව විසුරුවා හරිනු ලැබූ අවස්ථාවක දිසා අමාත්‍ය වරයා විසින්, ඒ සභාවේ බලතල ක්‍රියාත්මක කිරීම සහ කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීම කළ යුතු ය. තව ද ඒ අනුව, ඒ සභාවේ වෙනත් කිසිම සභිකයකු විසින් ඒ කාලසීමාව තුළ, ඒ බලතල ක්‍රියාත්මක කිරීම සහ කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීම නොකළ යුතු ය.

## III වන කොටස

### සංවර්ධන සභාවක රැස්වීම් සහ කටයුතු කරගෙන යාම

සභාවේ මහා සභා රැස්වීම.

6. (1) 7 වන වගන්තියේ පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, සංවර්ධන සභාවක තෝරා පත් කර ගන්නා ලද සභිකයන්ගේ ධුර කාලය ආරම්භ වීමෙන් පසු හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තෝරා පත් කර ගැනීම සඳහා වූ මහ මැතිවරණයට පසු හැකිතාක් ඉක්මණින් දිසා ලේකම්වරයා විසින්, ලිඛිත දැන්වීමක් මගින්, සභාවේ මහා සභා රැස්වීමක් සඳහා සභාවේ සියලු සභිකයන් කැඳවිය යුතු ය.

(2) සභාවේ මහා සභා රැස්වීම පැවැත්වීම සඳහා (1) වන උපවගන්තිය යටතේ නියමිත දිනයේ දී ඒ රැස්වීම කවර හෝ හේතුවක් නිසා පවත්වනු නොලැබූ අවස්ථාවක, වැඩිදුර ලිඛිත දැන්වීමක් හෝ දැන්වීම් මගින් දිසා ලේකම්වරයා විසින් ඒ රැස්වීම සඳහා, වෙනත් යම් දිනයක් අවශ්‍ය වන වාර ගණනක දී නියම කළ හැකි ය ; එසේ වුව ද ඒ වෙනත් දිනය ඔහු විසින් (1) වන උපවගන්තිය යටතේ පළමුවෙන් නියම කරන ලද දිනයෙන් පසුව එළඹෙන මාස තුනක කාලසීමාවක් ඇතුළත වූ දිනයක් විය යුතු ය.

සංවර්ධන සභාවල රැස්වීම්.

7. (1) සෑම වර්ෂයකම, සංවර්ධන සභාවක මහා සභා රැස්වීම් යටත් පිරිසෙයින් දොළහක් පැවැත්විය යුතු ය.

(2) සභාවක සභාපතිවරයා සුදුසු යයි කල්පනා කරන කවර වූ හෝ අවස්ථාවක, සභාපතිවරයා විසින් සභාවේ විශේෂ රැස්වීමක් දිසා කාර්යාලයේ දී පැවැත්වීමට කැඳවිය හැකි ය. එවැනි විශේෂ රැස්වීමක් පවත්වන ලෙස කවර හෝ සභිකයන් තිදෙනකු විසින් අත්සන් කරන ලද ලිඛිත ඉල්ලීමක් මත සභාපතිවරයා විසින් එසේ විශේෂ රැස්වීමක් දිසා කාර්යාලයේ දී පැවැත්වීමට කැඳවිය යුතු ය.

(3) සභාවේ සෑම මහා සභා රැස්වීමක්, විශේෂ රැස්වීමක් හෝ අධාළව කල්තැබූ රැස්වීමක් පිළිබඳව ද එවැනි යම් රැස්වීමක දී කිරීමට නියමිත කටයුතු පිළිබඳව ද ලියවිල්ලකින් වූ දැන්වීමක්, සභාපතිවරයා විසින් රැස්වීම පවත්වනු ලබන දිනයට යටත් පිරිසෙයින් දවස් හතරකට කලින්, එක් එක් සභිකයාට භාර දීමට සැලැස්විය යුතු ය.

(4) රැස්වීම කැඳවීමේ දැන්වීමෙහි සඳහන් කටයුතු හැර, වෙනත් කිසිම කටයුත්තක් සංවර්ධන සභාවේ අවසරය නොමැතිව, කවර හෝ මහා සභා රැස්වීමක් නැතහොත් විශේෂ රැස්වීමක් ඉදිරියෙහි තැබීම හෝ එහි දී කිරීම හෝ නොකළ යුතු ය.

ගණපූරණය හා තීරණ ගතයුත්තේ කෙසේ ද යන වග.

8. (1) සභාවේ කවර හෝ රැස්වීමක දී ඒ රැස්වීම පැවැත්වෙන දිනයෙහි ධුර දරන සභික සංඛ්‍යාවෙන් තුනෙන් එක් කොටසක් හෝ පැමිණ ඇත්නම් මිස, කිසිම කටයුත්තක් කරනු නොලැබිය යුතු ය. සභික සංඛ්‍යාවෙන් තුනෙන් එක් කොටසක් සම්පූර්ණ ගණනක් හා භාගයක් වන අවස්ථාවක, ඒ සම්පූර්ණ ගණනට හා භාගයට වැඩි ඊළඟ සම්පූර්ණ ගණන මේ උපවගන්තියේ කාර්යය සඳහා සභික සංඛ්‍යාවෙන් තුනෙන් එක් කොටස ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) සංවර්ධන සභාවක් විසින් තීරණය කළ යුතු බවට මේ පනතින් හෝ වෙනත් යම් ලිඛිත නීතියකින් හෝ බලය දී ඇති සියලු කාරණා හෝ ප්‍රශ්න යම් මහා සභා රැස්වීමක දී හෝ විශේෂ රැස්වීමක දී පැමිණ ඡන්දය දෙන සභිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය.

සභාවේ රැස්වීම්වල මූලාසනය දැරීම.

9. සංවර්ධන සභාවේ සෑම රැස්වීමක දී ම සභාපතිවරයා මූලාසනය දැරිය යුතු අතර, ඔහු පැමිණ නොමැති නම් පැමිණ සිටින සභිකයන් විසින් ඒ රැස්වීමේ මූලාසනය දැරීම පිණිස වෙනත් සභිකයකු තෝරා පත් කර ගත යුතු ය.

ගණපූරණය නොමැති විට රැස්වීම අධාළව කල් තැබීම.

10. සංවර්ධන සභාවක යම් මහා සභා රැස්වීමක දී හෝ විශේෂ රැස්වීමක දී ගණපූරණය සඳහා ප්‍රමාණවත් සභික සංඛ්‍යාවක් පැමිණ නොමැති නම්, ඒ රැස්වීම, සභාපතිවරයා විසින් හෝ සභාපතිවරයා පැමිණ නොමැති විටක, ඒ රැස්වීමේ මූලාසනය දරන සභිකයා විසින් හෝ නිශ්චය කරනු ලබන යම් දිනයකට අධාළව කල් තබනු ලැබිය යුතු ය. ඒ දිනය එසේ අධාළව කල් තබනු ලැබූ රැස්වීමේ දින සිට දවස් පහළොවකට පසුව නොවන දිනයක් විය යුතු ය. එසේ අධාළව කල් තබන ලද රැස්වීමෙහි ගණපූරණයක් වූයේ නම් ඒ රැස්වීම ඉදිරියේ තැබීමට නියමිතව තිබුණු කටයුතු හැර වෙනත් කිසිම කටයුත්තක් ඒ අධාළව කල් තබනු ලැබූ රැස්වීම ඉදිරියේ තැබීම සහ අවසන් කිරීම නොකළ යුතු ය.

සභාවේ රැස්වීම අධාළව කල් තැබීම.

11. සභාවේ ගණපූරණයක් ඇති යම් මහා සභා රැස්වීමක හෝ විශේෂ රැස්වීමක සභාපතිවරයා හෝ මූලාසනය දරන වෙනත් සභිකයා හෝ විසින්, රැස්වීමේ කැමැත්ත ඇතිව, රැස්වීම කලින් කල අධාළව කල් තබනු ලැබිය හැකි ය ; එහෙත් ඒ අධාළව කල් තැබීම සිදු වූයේ යම් රැස්වීමක දී ද ඒ රැස්වීමේ දී අවසන් නොකොට ඉතිරි වූ කටයුතු හැර වෙනත් කිසිම කටයුත්තක්, අධාළව කල් තබනු ලැබූ යම් රැස්වීමක දී, සභාවේ අවසරය නොමැතිව කරනු නොලැබිය යුතු ය.

රැස්වීම්වල වාර්තා.

12. සංවර්ධන සභාවක සියලු රැස්වීම්වල කටයුතු පිළිබඳ වාර්තා පිළියෙළ කොට ඒ වාර්තා තබා ගැනීමේ කාර්යය සඳහා පවත්වා ගෙන යනු ලබන පොතක නිවැරදිව සටහන් කළ යුතු අතර, ඒ වාර්තා, එක් එක් රැස්වීමෙන් පසුව සභාපතිවරයා විසින් හෝ මූලාසනය දරන වෙනත් සභිකයා විසින් හෝ අත්සන් කළ යුතු ය. තව ද ඒ වාර්තා කවර හෝ සභිකයකු විසින් නොමිලයේ ද එක් රුපියලක ගාස්තුවක් ගෙවා වෙනත් කවර හෝ තැනැත්තකු විසින් ද සියලු සාධාරණ වේලාවන්හි දී පරීක්ෂා කරනු ලැබීම සඳහා දිසා කාර්යාලයෙහි විවෘතව තබනු ලැබිය යුතු ය.

තීරක ඡන්දය.

13. සභාවේ කවර හෝ රැස්වීමකට පැමිණ ඡන්දය දෙන සභිකයන්ගේ ඡන්ද යම් ප්‍රශ්නයක් සම්බන්ධයෙන්, සමසේ බෙදී ඇති අවස්ථාවක සභාපතිවරයාට හෝ ඒ රැස්වීමෙහි මූලාසනය දරන වෙනත් සභිකයාට හෝ, සභිකයකු වශයෙන් ඔහුට ඇති ඡන්දයට අතිරේකව, තීරක ඡන්දයක් තිබිය යුතු ය.

දැන්වීම, තැපැල් මගින් භාරදිය හැකි බව.

14. සභාවේ රැස්වීම් පිළිබඳ සියලු දැන්වීම්, සභිකයාගේ සාමාන්‍ය පදිංචි ස්ථානයට හෝ අවසන් වරට ඔහු පදිංචිව සිටි ස්ථානය වශයෙන් දන සිටි ස්ථානයට හෝ ලිපිනය ලියා, තැපැල් මගින් යවනු ලැබිය හැකි ය ; තව ද දැන්වීමක් එසේ තැපැල් මගින් යවනු ලැබූ අවස්ථාවක, ඒ දැන්වීම ඇතුළත් ලිපිය සාමාන්‍ය තැපැල් මාර්ගයෙන් භාර දෙනු ලැබිය හැකි වන්නේ යම් කාලයක දී ද ඒ කාලයේ දී එය භාර දෙනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

සභාවේ විශේෂ කමිටු.

15. සංවර්ධන සභාවක කටයුතුවලට අදාළ යම් කාරණයක් පිළිබඳව පරීක්ෂාකොට වාර්තා කිරීමේ කාර්යය සඳහා, සුදුසු යයි ඒ සභාව සලකන යම් සභික සංඛ්‍යාවකින් සමන්විත විශේෂ කමිටු සභාවේ සභිකයන් අතුරින් සභාව විසින් කලින් කල පත් කරනු ලැබිය හැකි ය.

සභිකයන් විසින් ධුරය හිස් කිරීම.

16. (1) සංවර්ධන සභාවේ අවසරය පළමුවෙන් ලබා නොගෙන මාස තුනක කාලයක් සඳහා සභාවේ රැස්වීම්වලට පැමිණීම පැහැර හරින සංවර්ධන සභාවක යම් සභිකයකු, ඒ හේතුවෙන් ම ස්වකීය ධුරය හිස් කරන්නේ ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ධුරය හිස් කරන සභිකයකු සභාවේ නිලබලයෙන් පත් වූ සභිකයකු වන අවස්ථාවක, ඒ ධුරය හිස් කිරීම පිළිබඳව දිසා ලේකම්වරයා විසින් මැතිවරණ කොමසාරිස්වරයා වෙත දන්වනු ලැබිය යුතු ය ; ඉන් අනතුරුව කොමසාරිස්වරයා විසින්, ඒ ධුරය හිස් කරනු ලැබූ අවස්ථාවේ දී ඒ සභිකයා අයත්ව සිටියේ යම් පිළිගත් දේශපාලන පක්ෂයකට ද නැතහොත් ස්වාධීන කණ්ඩායමකට ද, අවස්ථාවෝචිත පරිදි, ඒ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්වරයා වෙත හෝ ස්වාධීන කණ්ඩායමේ නායකයා වෙත විධානයක් කර, ඒ විධානයේ දින සිට එක් මාසයක් ඇතුළත ඒ සභිකයා වෙනුවට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වීමට සුදුසුකම් ලත් තැනැත්තකු නම් කරන ලෙස විධාන කරනු ලැබිය යුතු අතර, ඒ ලේකම්වරයා හෝ නායකයා ඒ විධානය අනුව ක්‍රියා කළ යුතු ය :

එසේ වුව ද මේ උපවගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ නම් කරන ලද තැනැත්තා (1) වන උපවගන්තිය යටතේ ධුරය හිස් කරන නැතහොත් කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද විධානයක් අනුව ක්‍රියා කිරීමට පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්වරයා හෝ ස්වාධීන කණ්ඩායමේ

නායකයා පැහැර හරින විටක, (1) වන උපවගන්තිය යටතේ ධුරය හිස් කර ඇති සභිකයා වෙනුවට, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වීමට සුදුසුකම් ලත් තැනැත්තකු ජනාධිපතිවරයා විසින් නම් කරනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ නම් කරනු ලැබූ යම් තැනැත්තකු තමා අනුප්‍රාප්ත වන සභිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා ඒ නිලබලයෙන් පත් වූ සභිකයා වශයෙන් ධුරය දැරිය යුතු ය.

## IV වන කොටස

### සංවර්ධන සභාවල කාර්ය සහ කර්තව්‍ය

17. (1) සංවර්ධන සභාවක කර්තව්‍යවලට— සංවර්ධන සභාවල කර්තව්‍ය.

(අ) විධායක කමිටුව විසින් සංවර්ධන සභාව වෙත ඉදිරිපත් කරනු ලබන වාර්ෂික සංවර්ධන සැලැස්ම අනුමත කිරීම ;

(ආ) විධායක කමිටුව මගින් ඒ සැලැස්ම ක්‍රියාත්මක කිරීම ;

(ඇ) අතුරු ව්‍යවස්ථා සෑදීම ;

(ඈ) සභාවේ ආදයම සංවර්ධන කාර්ය සඳහා ආයෝජනය කිරීම ;

(ඉ) මේ පනතේ පළමුවන උපලේඛනයෙහි ඇතුළත් කර නොමැති යම් විෂයයක් සම්බන්ධයෙන් සංවර්ධන යෝජනා ක්‍රමයක් සකස් කිරීම සහ ඒ යෝජනා ක්‍රමය අමාත්‍ය වරයාගේ එකඟත්වය ඇතිව, අනුමතය සඳහා උචිත අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීම

ඇතුළත් විය යුතු ය.

(2) ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින්, අමාත්‍යවර යාගේ එකඟත්වය ඇතිව උචිත අමාත්‍යවරයා විසින්, මේ පනතේ පළමු වන උප ලේඛනයෙහි ඇතුළත් නොවන යම් විෂයයකට අදාළ යෝජනා ක්‍රමයක් හෝ වැඩක් වන්නා වූ ද ඒ නියමයෙහි සඳහන් කරනු ලැබිය යුතු වූ ද යම් සංවර්ධන යෝජනා ක්‍රමයක් හෝ වැඩක් ක්‍රියාත්මක කිරීම, ඒ නියමයෙහි සඳහන් කරනු ලබන නියම හා කොන්දේසිවලට යටත්ව, සංවර්ධන සභාවකට පවරනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ වූ නියමයක, ඒ නියමය අදාළ වන පැවරීම බලගැන්වීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සියලු විධිවිධාන ඇතුළත් විය යුතු ය.

18. (1) අවස්ථාවෝචිත පරිදි, මහ නගර සභා ආඥාපනතින් හෝ නගර සභා ආඥාපනතින් නැතහොත් මහ නගර සභා ආඥාපනත යටතේ හෝ නගර සභා ආඥාපනත යටතේ යම් මහ නගර සභා හෝ නගර සභා ප්‍රදේශයක් සඳහා සංස්ථාපනය කරනු ලැබූ යම් මහ නගර සභාවකට හෝ නගර සභාවකට යම් කාර්යයක් හෝ කර්තව්‍යයක් මහ නගර සභා ආඥා පනතින් හෝ නගර සභා ආඥාපනතින් නැතහොත් වෙනත් යම් ලිඛිත නීතියකින් නියම කර ඇති හෝ වෙන් කර දී ඇති අවස්ථාවක, යම් සංවර්ධන සභාවක් සංස්ථාපනය කරනු ලැබුවේ යම් පරිපාලන දිස්ත්‍රික්ක යක් සඳහා ද ඒ පරිපාලන දිස්ත්‍රික්කය ඇතුළත පිහිටි ඒ මහ නගර සභාවේ හෝ නගර සභාවේ පරිපාලන සීමා ඇතුළත, මේ පනතින් හෝ සංවර්ධන සභා සුළු නගර සභාවල හා ගම් සභාවල අනුප්‍රාප්තිකයන් බව සහ මහ නගර සභා හා නගර සභා ප්‍රදේශවල ඇතැම් කාර්ය හා කර්තව්‍ය ඉටු නොකළ යුතු බව.

මේ පනත යටතේ ඒ සංවර්ධන සභාව වෙත නියම කරන ලද හෝ වෙන්කර දෙන ලද එවැනි කාර්යයක් හෝ කර්තව්‍යයක්, ඒ සංවර්ධන සභාව විසින් ඉටු කරනු නොලැබිය යුතු ය.

(2) ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන යම් දිනයක සිට—

(අ) සංවර්ධන සභාවක් සංස්ථාපනය කරනු ලැබුවේ යම් පරිපාලන දිස්ත්‍රික්කයක් සඳහා ද ඒ පරිපාලන දිස්ත්‍රික්කය ඇතුළත පිහිටි යම් සුළු නගර සභා හෝ ගම්සභා ප්‍රදේශයක් සඳහා සංස්ථාපනය කරනු ලැබූ යම් සුළු නගර සභාවක් හෝ ගම් සභාවක් විසින් නැතහොත් අවස්ථාවෝචිත පරිදි, සුළු නගර සභා ආඥාපනතේ හෝ ගම් සභා ආඥා පනතේ විධිවිධාන යටතේ එවැනි යම් සභාවක කටයුතු පරිපාලනය කරන යම් තැනැත්තකු විසින් ක්‍රියාත්මක කරනු ලබන යම් බලතල හෝ ඉටුකරනු ලබන යම් කාර්ය හා කර්තව්‍ය සංවර්ධන සභාවක් විසින් ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම කළ යුතු ය; තව ද ඒ අනුව ඒ ආඥාපනත්වල හෝ වෙනත් යම් ලිඛිත නීතියක හෝ යම් සුළු නගර සභාවක් හෝ ගම් සභාවක් සම්බන්ධයෙන් කරන ලද යම් සඳහනක් සංවර්ධන සභාවක් සම්බන්ධයෙන් කරන ලද සඳහනක් ලෙස සලකනු ලැබිය යුතු ය;

(ආ) එවැනි යම් සුළු නගර සභාවක හෝ ගම් සභාවක නිශ්චල වුව ද චංචල වුව ද සියලු දේපළ සහ වත්කම් හා බැරකම් ඒ සංවර්ධන සභාවේ දේපළ සහ වත්කම් හා බැරකම් ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඇ) ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනතින් පිහිටුවන ලද පළාත් පාලන සේවාවේ සාමාජිකයන් වන ඒ සුළු නගර සභාවේ හෝ ගම් සභාවේ සේවා නියුක්තයන් තවදුරටත් ඒ සේවාවේ සාමාජිකයන් විය යුතු ය; තව ද සුළු නගර සභාවල හා ගම් සභාවල පවත්නා සියලු තනතුරු සංවර්ධන සභාවල තනතුරු වශයෙන් තවදුරටත් පැවතිය යුතු අතර, අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව හැර, ඒ තනතුරු අහෝසි කරනු නොලැබිය යුතු ය;

(ඈ) ඒ සුළු නගර සභාවල හෝ ගම් සභාවල වෙනත් සියලු සේවා නියුක්තයන් මේ වගන්තිය යටතේ නිශ්චය කරනු ලැබූ දිනයට පෙරාතුව ම ඔවුන් විසින් භුක්ති විඳින ලද නියම හා කොන්දේසි වලට වඩා අඩු වාසිසහගත නොවන නියම හා කොන්දේසි මත, 47 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ දිසා සේවාවේ නිලධරයන් හා සේවකයන් විය යුතු ය;

(ඉ) මේ වගන්තිය යටතේ නිශ්චය කරනු ලබන දිනයට පෙරාතුව ම යම් ප්‍රදේශයක බලාත්මකව පැවති සහ සුළු නගර සභා ආඥා පනත හා ගම් සභා ආඥාපනත යටතේ අමාත්‍යවරයා විසින් සාදන ලද සියලු රීති ද

ඒ සුළු නගර සභාව හෝ ඒ ගම් සභාව විසින් සාදන ලද සියලු අතුරු ව්‍යවස්ථා ද, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ සංවර්ධන සභාව විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථා ලෙස, සලකනු ලැබිය යුතු අතර, ඒවා ඒ ප්‍රදේශය ඇතුළත අදාළ විය යුතු ය ;

(ට) ඒ සුළු නගර සභාවේ හෝ ගම් සභාවේ කටයුතු පරිපාලනය කරන යම් නිලධරයකු, මේ වගන්තිය යටතේ නිශ්චය කරනු ලබන දිනයෙහි සිට, ඒ නිලධරයා වශයෙන් කර්තව්‍ය ඉටු කිරීම නතර කළ යුතු ය.

## V වන කොටස

### සංවර්ධන අරමුදල

19. (1) සෑම සංවර්ධන සභාවක් විසින් ම, එහි සාමාන්‍ය මුදල් කටයුතු සඳහා (මෙහි මින් මතු ''අරමුදල'' යනුවෙන් සඳහන් කරනු ලබන) සංවර්ධන අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු ය. සංවර්ධන අරමුදල සහ එහි සන්තති.

(2) (අ) මේ පනත හෝ වෙනත් යම් ලිඛිත නීතියක් හෝ ප්‍රකාර සභාව විසින් අය කරනු ලබන සියලු වරිපනම්, බදු, තීරු බදු, ගාස්තු හා වෙනත් අය කිරීම් ;

(ආ) මේ පනතේ හෝ පරිපාලනය සභාව වෙත පැවරෙන යම් නිති ප්‍රඥප්තියක හෝ අධිකාරය යටතේ අය කරනු ලබන සියලු දඩ මුදල් හා අය කරගනු ලබන සියලු දණ්ඩන ;

(ඇ) විකිණීම්, බදු දීම් හෝ සභාවෙහි වෙනත් ගනුදෙනු හෝ මගින් ලබා ගනු ලබන සියලු මුදල් ;

(ඈ) සභාව වෙත සතු වී ඇති යම් දේපළකින් හෝ යම් පොදු සේවාවක් පරිපාලනය කිරීමෙන් හෝ සභාව විසින් ලබාගනු ලබන සියලු ආදායම් ;

(ඉ) යෝජනා සම්මතයක් මගින් හෝ අන්‍යාකාරයකින් පාර්ලිමේන්තුව විසින් සභාව වෙත කලින් කල වෙන් කර දෙනු ලබන හෝ දෙනු ලබන සියලු මුදල් සහ සියලු ආදායම් මාර්ග ;

(ඊ) අමාත්‍යවරයා විමසා, උචිත අමාත්‍යවරයා විසින් සභාවට වෙන් කර දෙනු ලබන සියලු ප්‍රදාන හා මුදල් වෙන් කර දීම් ;

(උ) අමාත්‍යවරයා විමසා, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමතය ඇතිව සභාව විසින් ලබා ගනු ලබන සියලු ණයවල මුදල් ;

(ඌ) අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව, සාමාන්‍යයෙන් හෝ යම් නිශ්චිත යෝජනා ක්‍රමයක් සඳහා කරන ලද යම් පරිත්‍යාග හෝ වෙනත් ආධාර ;

(එ) සභාවේ බලතල හා කාර්ය ක්‍රියාත්මක කිරීමේ දී අන්‍යාකාරයකින් සභාවට ලැබෙන සියලු මුදල්

අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.

සංවර්ධන සභාවකට ලැබෙන මුදල් බැංකුවක තැන්පත් කළ යුතු බව.

**20.** සංවර්ධන සභාවකට ලැබෙන්නා වූ ද අරමුදලට ගෙවිය යුතු වූ ද සියලු මුදල් අනුමත බැංකුවක තැන්පත් කරනු ලැබිය යුතු අතර, ''සංවර්ධන අරමුදල'' යනුවෙන් නම් කරන ලද ගිණුමකට ඒ මුදල් බැර කරනු ලැබිය යුතු ය.

මේ වගන්තියෙහි ''අනුමත බැංකුව'' යන්නෙන්, සංවර්ධන සභාවක මුදල් තැන්පත් කරනු ලැබිය හැකි බැංකුවක් ලෙස, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින්, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන බැංකුවක් අදහස් වේ.

අරමුදලෙන් කිසියම් කොටසක් ආයෝජනය කිරීමට ඇති බලය.

**21.** විධායක කමිටුව විසින්, අරමුදලෙහි කිසියම් කොටසක් පහත දැක්වෙන ආයෝජනවලින් එකක හෝ වැඩි ගණනක සභාව වෙනුවෙන් ආයෝජනය කරනු ලැබිය හැකි ය :—

(අ) ආණ්ඩුවේ ස්කන්ධ හෝ වෙනත් සුරැකුම් පත් ;

(ආ) ආණ්ඩුව විසින් සහතික කරනු ලබන වෙනත් සුරැකුම් පත් ;

(ඇ) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද වෙනත් යම් ආයෝජනයක්.

අරමුදල උපයෝගී කර ගැනීම.

**22.** (1) අරමුදලෙන්—

(අ) වාර්ෂික සංවර්ධන සැලැස්ම හෝ 17 වන වගන්තිය යටතේ සභාව වෙත පවරනු ලැබූ වෙනත් යම් සංවර්ධන යෝජනා ක්‍රමයක් හෝ වැඩක් ක්‍රියාත්මක කිරීමේ දී සභාව විසින් දරන ලද සියලු වියදම් ;

(ආ) කම්කරු වන්දි ආඥාපනත යටතේ දරන ලද යම් වගකීමක් වෙනුවෙන් සභාව විසින් ගෙවනු ලැබිය යුතු සියලු මුදල් ;

(ඇ) සභාවට අයත් හෝ සභාව සතු වී ඇති හෝ යම් දේපළක් රක්ෂණය කිරීම සඳහා නැතහොත් කම්කරු වන්දි ආඥා පනත යටතේ සභාව විසින් දරනු ලබන යම් වගකීමක් වෙනු වෙන් රක්ෂණය කිරීම සඳහා වාරිකය වශයෙන් සභාව විසින් ගෙවනු ලැබිය යුතු සියලු මුදල් ;

(ඈ) මේ පනත හෝ වෙනත් යම් ලිඛිත නීතියක් හෝ මගින් නැත හොත් මේ පනත හෝ වෙනත් යම් ලිඛිත නීතියක් හෝ යටතේ ආපසු ගෙවීමට සභාවට බලය දෙනු ලැබූ හෝ නියම කරනු ලැබූ සියලු මුදල් ;

(ඉ) යම් පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය ඉඩම අත්කර ගැනීමේ දී සභාව විසින් දරන ලද සියලු වියදම් ;

(ඊ) දිස්ත්‍රික්කයේ විනෝද ක්‍රීඩාවල නැතහොත් විනෝද කටයුතුවල කාර්යය සඳහා හෝ දුගියන්ට සහන සලසාදීම සඳහා හෝ කිසියම් පුණ්‍ය නැ හොත් යහ සාධක සමිතියකට හෝ ආයතනයකට ආධාර පිණිස හෝ අසනීපවීමේ, ණයගැති වීමේ නැතහොත් ආපදා අවස්ථාවල දී සභාවේ නිලධරයන්ට

හෝ සේවකයන්ට සහන හෝ ආධාර දීමේ කාර්ය සඳහා සංස්ථාපනය කරන ලද හෝ පිහිටුවන ලද කිසියම් අරමුදලක් නැතහොත් යෝජනා ක්‍රමයක් සඳහා සභාව විසින් සම්මත කරනු ලබන සියලු දායක මුදල් ;

(උ) යම් පොදු උත්සවවල වියදම් වෙනුවෙන් සභාව විසින් සම්මත කරනු ලබන්නා වූ ද යම් වර්ෂයක දී මුළු එකතුව රුපියල් දෙදහසක් නොඉක්මවන්නා වූ ද යම් දායක මුදල් සහ එවැනි යම් උත්සවවල වියදම් වෙනුවෙන්, අමාත්‍ය වරයාගේ ලියවිල්ලකින් වූ පූර්ව අනුමතය ඇතිව සභාව විසින් සම්මත කරනු ලබන වෙනත් යම් දායක මුදල් ;

(ඌ) මේ පනත හෝ වෙනත් යම් ලිඛිත නීතියක් මගින් හෝ මේ පනත හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ හෝ පිහිටුවීමට, පවත්වා ගෙන යාමට නැතහොත් සැලසීමට සභාවට බලය දී ඇති කවර හෝ ආකාරයක පොදු සේවාවක් පිහිටුවීමේ දී හා පවත්වා ගෙන යාමේ දී සභාව විසින් දරන ලද සියලු වියදම් ;

(එ) සභාවේ සභිකයන්ට ද, දිසා සේවාවෙහි නිලධරයන්ට හා සේවා නියුක්තයන්ට ද ගෙවනු ලැබිය යුතු, අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන, යම් වේතන, දීමනා හෝ සම්මාන මුදල් ;

(ඒ) මේ පනත හෝ වෙනත් යම් ලිඛිත නීතියක් මගින් හෝ මේ පනත හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ හෝ අරමුදලෙන් ගෙවීමට නියමිත හෝ බලය දී ඇති සියලු මුදල්

එක් එක් විධායක කමිටුව විසින් ගෙවනු ලැබිය යුතු ය.

(2) සභාවේ යෝජනා සම්මතයක බලය යටතේ හැර, අරමුදලෙන් කිසිම ගෙවීමක් කරනු නොලැබිය යුතු ය.

අරමුදලෙන් ගෙවීම සඳහා වූ ඇණවුම්, චෙක්පත් ආදිය.

23. අරමුදලෙන් මුදල් ගෙවීම සඳහා වූ සියලු ඇණවුම් හෝ චෙක්පත් දිසා ලේකම්වරයා විසින් හෝ ඔහු වෙනුවෙන් අත්සන් කිරීමට ඔහු විසින් බලය දෙන ලද යම් නිලධරයකු විසින් සහ තත්කාර්ය සඳහා සංවර්ධන සභාව විසින් විශේෂයෙන් බලය දෙන ලද නිලධරයන් අතුරෙන් වෙනත් නිලධරයන් දෙදෙනකු විසින් අත්සන් කරනු ලැබිය යුතු ය. තවද එසේ අත්සන් තබන ලද සියලු ඇණවුම් හෝ චෙක්පත් අරමුදල පිහිටුවනු ලැබ ඇත්තේ යම් බැංකුවක ද, ඒ බැංකුව විසින් එකී අරමුදලෙන් ගෙවනු ලැබිය හැකි ය.

අරමුදලට අය වූ සහ අරමුදලෙන් වැය වූ මුදල් පිළිබඳ ප්‍රකාශය.

24. සංවර්ධන සභාවක එක් එක් මහා සභා රැස්වීමේ දී, අරමුදල සම්බන්ධයෙන්, ඉකුත් වර්ෂයෙහි අවසානයෙහි සිට, රැස්වීම පැවැත්වෙන මාසයට ඉහතින් වූ මාසයේ අවසානය තෙක් අය සහ වියදම් පිළිබඳ ප්‍රකාශයක්, සභාපතිවරයා විසින්, සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. ඒ ප්‍රකාශය, ඒ රැස්වීමේ කටයුතු පිළිබඳ වාර්තාව ද සමග විගණකාධිපතිවරයාගේ දැන ගැනීම සඳහා ඔහු වෙත නොපමාව යවනු ලැබිය යුතු ය.

## VI වන කොටස

## බදු පැනවීම සහ ආදායම පැවරීම

බදු ආදිය අය කිරීමට සංවර්ධන සභාවකට බලය ඇති බව.

25. සභාව විසින් නිශ්චය කරනු ලැබ, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද යම් බදු, වරිපනම් හෝ වෙනත් ගාස්තු, යම් සංවර්ධන සැලැස්මකට අදාළව අතුරු ව්‍යවස්ථාවක් මගින් අය කිරීමට සංවර්ධන සභාවකට බලය තිබිය යුතු අතර ඒ අතුරු ව්‍යවස්ථාව පාර්ලිමේන්තුව විසින් ස්ථිර කරනු ලැබ ඒ ස්ථිර කිරීම පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ විට, එය 70 වන වගන්තියට අනුකූලව බලාත්මක විය යුතු ය.

සංවර්ධන සභාවලට අමාත්‍ය මණ්ඩලය විසින් මුදල් වෙන් කර දිය හැකි බව.

26. සංවර්ධන සභාවල බලතල ක්‍රියාත්මක කිරීම සහ කර්තව්‍ය හා කාර්ය ඉටු කිරීම පිණිස, ආණ්ඩුවට ගෙවන ලද හෝ ආණ්ඩුව විසින් අය කර ගන්නා ලද ඇතැම් ආදායම් අමාත්‍ය මණ්ඩලය විසින් ඒ සංවර්ධන සභාවලට වෙන් කර දෙනු ලැබිය හැකි ය. ඒ මුදල පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයකින් ගෙවනු ලැබිය යුතු ය.

## VII වන කොටස

## ණය

සංවර්ධන සභාවල ණයට ගැනීමේ බලතල.

27. සංවර්ධන සභාවක් විසින් අමාත්‍යවරයාගේ අනුමතය සහ මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, සභාවේ කාර්ය අතුරින් යම් කාර්යයක් සඳහා අවශ්‍ය වන මුදල්, ආණ්ඩුවෙන් හෝ යම් බැංකුවකින් හෝ වෙනත් ආයතනයකින් හෝ ණයට ලබා ගත හැකි ය.

උකස් කිරීම් මගින් සංවර්ධන සභාවක් විසින් මුදල් ලබා ගත හැකි බව.

28. මුදල් ණයට ලබා ගැනීමට මේ පනත යටතේ හෝ මේ පනත මගින් හෝ සංවර්ධන සභාවකට බලය දී ඇති අවස්ථාවක, ඒ සභාව විසින්, මේ පනතේ විධිවිධානවලට යටත්ව උකස් කිරීම් මගින්, ඒ මුදල් ලබා ගත හැකි ය.

ණයට ගන්නා ලද මුදල් සභාවේ ආදායම කෙරෙහි වැය බරක් විය යුතු බව.

29. (1) සංවර්ධන සභාවක් විසින් මේ පනත යටතේ ණයට ගන්නා ලද සියලු මුදල්, සභාවේ සියලු බදු, දේපළ සහ ආදායම කෙරෙහි විශේෂත්වයකින් තොරව වැය බරක් විය යුතු ය.

(2) සංවර්ධන සභාවක් විසින් මේ පනත යටතේ ඇති කර ගන්නා ලද උකස් සියල්ල, මේ වගන්තියේ විධිවිධානවලට යටත්ව, කිසිදු ප්‍රමුඛත්වයක් නොමැතිව, සමාන ලෙස පැවතිය යුතු ය.

අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි බව.

30. මේ කොටසෙහි ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ හා විධිවිධාන බල ගැන්වීමේ කාර්යය සඳහා, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

## VIII වන කොටස

## විධායක කමිටුව

31. (1) සංවර්ධන සභාවක විධායක කමිටුවක් තිබිය යුතු අතර, ඒ විධායක කමිටුව දිසා අමාත්‍යවරයාගෙන්, සංවර්ධන සභාවේ සභාපතිවරයාගෙන් සහ දිසා අමාත්‍යවරයා විසින් සභාපතිවරයා විමසා පත් කරනු ලබන සභාවේ වෙනත් සභිකයන් දෙදෙනකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතු ය: සංවර්ධන සභාවක විධායක කමිටුව.

එසේ වුව ද 61 (2) වන වගන්තිය යටතේ විධායක කමිටුව විසුරුවා හරිනු ලැබූ අවස්ථාවක, විසුරුවා හරින ලද කමිටුව වෙනුවට පත් කරන ලද අලුත් විධායක කමිටුව, දිසා අමාත්‍යවරයාගෙන් සහ ඒ සභාවේ විශ්වාසය දිනාගන්නා වූ ද දිසා අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන්නා වූ ද සභාවේ වෙනත් සභිකයන් දෙදෙනකුගෙන් සමන්විත විය යුතු ය.

(2) දිසා අමාත්‍යවරයා විධායක කමිටුවෙහි ප්‍රධානයා විය යුතු අතර, විධායක කමිටුවෙහි එක් එක් සාමාජිකයා වෙත පැවරිය යුතු කර්තව්‍යවල ස්වභාවය, සභාපතිවරයා විමසා, ජනාධිපතිවරයාගේ එකඟත්වය ඇතිව, ඔහු විසින් නිශ්චය කරනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ තමා වෙත පවරන ලද එක් එක් කර්තව්‍යය දිස්ත්‍රික්කය ඇතුළත ඉටු කිරීම සම්බන්ධයෙන් විධායක කමිටුවෙහි එක් එක් සාමාජිකයා වගකිව යුතු ය.

(4) විධායක කමිටුවේ සාමාජිකයන් පෞද්ගලිකව හා සාමූහිකව සභාවට වගකිව යුතු ය.

32. දිසා අමාත්‍යවරයා, සංවර්ධන සභාවක විධායක කමිටුවෙහි රැස්වීම්වල මූලාසනය දැරිය යුතු ය. විධායක කමිටුවේ රැස්වීම්වල සභාපති ධුරය.

33. සංවර්ධන සභාවක විධායක කමිටුවෙහි යම් රැස්වීමක් සඳහා ගණපූරණය ඒ කමිටුවෙහි සාමාජිකයන් තිදෙනකුගෙන් සමන්විත විය යුතු ය: ගණපූරණය.

එසේ වුව ද 61 වන වගන්තියෙහි (3) වන උපවගන්තිය යටතේ, පත් කරන ලද කමිටුවක් සම්බන්ධයෙන් වන විට, ගණපූරණය සාමාජිකයන් දෙදෙනකුගෙන් සමන්විත විය යුතු ය.

34. සැම මාසයක දී ම යටත් පිරිසෙයින් එක් වරක් හෝ විධායක කමිටුව රැස්විය යුතු ය. විධායක කමිටුවේ රැස්වීමට, දිසා ලේකම්වරයා හෝ දිසා ලේකම්වරයා පැමිණ නොමැති විටක ඔහු විසින් ලියවිල්ලකින් බලය දෙනු ලැබූ නිලධරයකු හෝ පැමිණ සිටිය යුතු අතර, ඒ රැස්වීමෙහි කටයුතු පිළිබඳ වාර්තා ඔහු විසින් තබාගත යුතු ය. විධායක කමිටුවේ රැස්වීම.

විධායක කමිටුවක කර්තව්‍ය.

**35.** සංවර්ධන සභාවක විධායක කමිටුව විසින්—

(අ) මේ පනතේ පළමුවන උපලේඛනයෙහි සඳහන් සියලු විෂයයන් හෝ ඉන් යම් විෂයයක් සම්බන්ධයෙන් උචිත අමාත්‍යවරයා විසින් පිළියෙල කරන ලද කෙටුම්පත් සංවර්ධන යෝජනා සලකා බැලීම, උචිත අමාත්‍යවරයා විමසා වෙනත් යෝජනා සකස් කිරීම, ඒ සියලු යෝජනා හෝ ඉන් යම් යෝජනාවක් ඇතුළත් කරමින් වාර්ෂික සංවර්ධන සැලැස්මක් පිළියෙල කිරීම සහ ඒ සැලැස්ම අමාත්‍යවරයා මගින් සංවර්ධන සභාව වෙත එහි අනුමතය සඳහා ඉදිරිපත් කිරීම කළ යුතු ය ;

(ආ) ලබා ගත හැකි ආදායම පිළිබඳ ඇස්තමේන්තුවක් ද ඉදිරි මුදල් වර්ෂය සඳහා යෝජිත වියදම පිළිබඳ විස්තර ද ඇතුළත් අය වැය ලේඛනයක් පිළියෙල කරනු ලැබිය යුතු ය ;

(ඇ) සභාවේ පරිපාලනය කර ගෙන යා යුතු ය ;

(ඈ) වාර්ෂික සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කළ යුතු ය ;

(ඉ) ජනාධිපතිවරයාගේ එකඟත්වය ඇතිව දිසා අමාත්‍යවරයා විසින් විධායක කමිටුව වෙත පවරන ලද යම් බලතල ක්‍රියාත්මක කිරීම සහ කර්තව්‍ය හා කාර්ය ඉටු කිරීම කළ යුතු ය.

විධායක කමිටුවක බලතල.

**36.** (1) (2) වන උපවගන්තියේ විධිවිධානවලට හා මේ පනතේ වෙනත් විධිවිධානවලට සහ ඒ යටතේ සාදන ලද නියෝගවලට යටත්ව, සංවර්ධන සභාව වෙනුවෙන් විධායක කමිටුවක් විසින් පහත සඳහන් බලතල ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය :—

(අ) අවශ්‍ය යයි විධායක කමිටුව සලකන සියලු තනතුරු හෝ ධුර හෝ ඇති කිරීම ;

(ආ) (අ) ඡේදයෙහි සඳහන් තනතුරුවලට නැතහොත් ධුරවලට පත් කිරීම් කිරීම සහ අමාත්‍යවරයා විමසා කමිටුව සුදුසු යයි කල්පනා කරන යම් වේතන, දීමනා හෝ පාරිශ්‍රමික ඒ තනතුරුවලට හෝ ධුරවලට නියම කිරීම ;

(ඇ) (i) 88 වන වගන්තියෙහි සඳහන් යම් ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් සම්බන්ධයෙන් වන විට ජනාධිපතිවරයාගේ අනුමතය ඇතිව,

(ii) 18 (2) (ආ) වගන්තියෙහි සඳහන් යම් දේපළක් සම්බන්ධයෙන් වන විට, අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව

සභාවට අයත් හෝ සභාව සතුව ඇති යම් ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් කැබලි වශයෙන් හෝ කොටස් වශයෙන් හෝ ප්‍රසිද්ධ වෙන්දේසියේ නැතහොත් ප්‍රසිද්ධ වෙන්දේසියෙන් නොවන අන්‍යාකාරයකින් විකිණීම හෝ බදු දීම ;

(ඈ) යම් ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් මිලට ගැනීම හෝ බද්දට ගැනීම ;

(ඉ) මේ පනතින් ප්‍රකාශිත විධිවිධානවලට යටත්ව, කරනු ලැබිය යුතු යම් වැඩක් හෝ ඉටු කරනු ලැබිය යුතු යම් සේවාවක් හෝ සපයනු ලැබිය යුතු යම් භාණ්ඩ නැතහොත් ද්‍රව්‍ය හෝ සඳහා, යම් තැනැත්තකු සමඟ යම් ගිවිසුමකට ඇතුළත් වීම ;

(ඊ) මේ පනත හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථා හෝ නියෝග හෝ සම්බන්ධයෙන් කරනු ලබන සියලු කඩ කිරීම් සොයා ගැනීම, වැළැක්වීම සහ නතර කිරීම සඳහා හෝ මේ පනත මගින් හෝ මේ පනත යටතේ, යම් ඉඩම්වල සහ ගොඩනැගිලිවල අයිතිකරුවන් හෝ පදිංචිකරුවන් විසින් කරනු ලැබීමට නියමිත යම් ක්‍රියා කිරීම ඒ අයිතිකරු හෝ පදිංචිකරු විසින් පැහැර හරිනු ලැබ තිබේ ද නැතහොත් පැහැර හැර ඇතැයි සලකනු ලැබේ ද ඒ ක්‍රියා ඔවුන් ලවා කරවීම සඳහා හෝ බලය දෙනු ලැබූ යම් නිලධරයන් සහ ඔවුන් සමඟ යන කම්කරුවන් මගින් අවශ්‍ය වන පරිදි ඒ ඉඩම්වලට සහ ගොඩනැගිලිවලට ඇතුළුවීම සහ ඒවා සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීම ;

(උ) සභාවේ අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමේ හෝ ආරක්ෂා කිරීමේ නැතහොත් ස්වකීය කාර්ය ඉටු කිරීමේ දී හෝ ඉටු කිරීමට බලාපොරොත්තු වීමේ දී යම් නිලධරයන් හෝ සාමාජිකයන් හෝ ආරක්ෂා කිරීමේ කාර්ය සඳහා, පැවරීම හෝ විත්තිවාචක ඉදිරිපත් කිරීම අවශ්‍ය යයි සභාව සලකන යම් නඩු කටයුතු පැවරීම හෝ ඒ නඩු කටයුතුවල දී විත්තිවාචක ඉදිරිපත් කිරීම ;

(ඌ) වාර්ෂික සංවර්ධන සැලැස්ම ක්‍රියාවේ යෙදවීම සඳහා හෝ ඒ සභාවේ බලතල කිසිවක් ක්‍රියාත්මක කිරීම සහ කර්තව්‍ය කිසිවක් ඉටු කිරීම සඳහා හෝ අමාත්‍යවරයාගේ අනුමතය සහ මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, ණය ලබා ගැනීම ;

(එ) කවර වූ හෝ තැනැත්තකුට විරුද්ධව සභාව විසින් ලබා ගන්නා ලද යම් අධිකරණ තීන්දු ප්‍රකාශයක් හෝ ආඥාවක් හෝ ක්‍රියාවෙහි යෙදවීමෙහි ලා විකුණනු ලබන යම් ඉඩමක් හෝ වෙනත් නිශ්චල දේපළක් මිලට ගැනීම සහ එයනැවත විකිණීම;

(ඒ) මේ පනත මගින් සභාව වෙත සතු කරන ලද හෝ පවරන ලද සියලු බලතල ක්‍රියාත්මක කිරීම සහ සියලු කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීම සහ මේ පනත යටතේ වූ බලතල ක්‍රියාත්මක කිරීම සහ කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීම හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික සියලු බලතල ක්‍රියාත්මක කිරීම සහ කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීම.

(2) ස්වකීය තනතුරු තාවකාලික හෝ අනියම් ස්වභාවයක පිහිටියා වූ හෝ ඒ තනතුරුවලට නියමිත වාර්ෂික උපරිම වැටුප අමාත්‍යවරයා විසින් නියම කරන ලද මුදලක් නොඉක්මවන්නා වූ නිලධරයන් හා සේවකයන් නොවන සියලු නිලධරයන් හා සේවකයන් සම්බන්ධයෙන්, ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනතේ විධිවිධාන, 18 (2) (ඇ) වගන්තියට යටත් ව, සංවර්ධන සභාවකට අදාළ විය යුතු ය.

**37.** විධායක කමිටුවේ යම් රැස්වීමක දී පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ ඡන්ද යම් ප්‍රශ්නයක් සම්බන්ධයෙන් සමසේ බෙදී ඇති අවස්ථාවක දී අමාත්‍යවරයාට සාමාජිකයකු වශයෙන් ඔහුට ඇති ඡන්දයට අතිරේකව තීරක ඡන්දයක් ද තිබිය යුතු ය. තීරක ඡන්දය.

දැන්වීම් තැපැල් මගින් භාර දිය හැකි බව.

**38.** විධායක කමිටුවක රැස්වීම් පිළිබඳ සියලු දැන්වීම්, සාමාජිකයාගේ සාමාන්‍ය පදිංචි ස්ථානයට හෝ අවසන් වරට ඔහු පදිංචිව සිටි ස්ථානය වශයෙන් දැන සිටි ස්ථානයට හෝ ලිපිනය ලියා තැපැල් මගින් යවනු ලැබිය හැකි ය ; තව ද දැන්වීමක් එසේ තැපැල් මගින් යවනු ලැබූ අවස්ථාවක, ඒ දැන්වීම ඇතුළත් ලිපිය සාමාන්‍ය තැපැල් මාර්ගයෙන් භාර දෙනු ලැබිය හැකි වන්නේ යම් කාලයක දී ද ඒ කාලයේ දී එය භාර දෙනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

## IX වන කොටස

### වාර්ෂික සංවර්ධන සැලැස්ම සහ අය වැය ලේඛනය

වාර්ෂික සංවර්ධන සැලැස්ම සහ අය වැය ලේඛනය.

**39.** (1) සංවර්ධන සභාවක විධායක කමිටුව විසින්, 35 (අ) වගන්තිය යටතේ සලකා බලන ලද වාර්ෂික සංවර්ධන සැලැස්ම ඒ කමිටුව විසින්, අමාත්‍යවරයා මගින්, සභාවේ අනුමතය සඳහා සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) ලබාගත හැකි ආදායම පිළිබඳ ඇස්තමේන්තුවක් සහ ඉදිරි මුදල් වර්ෂය සඳහා සභාවේ යෝජිත වියදම් පිළිබඳ විස්තර ඇතුළත් අය වැය ලේඛනයක්, විධායක කමිටුව විසින් පිළියෙල කරනු ලැබිය යුතු ය.

වාර්ෂික සංවර්ධන සැලැස්ම සහ අය වැය ලේඛනය පිළිබඳ කාර්ය පටිපාටිය.

**40.** සංවර්ධන සභාවක සෑම වාර්ෂික සංවර්ධන සැලැස්මක් ම සහ අයවැය ලේඛනයක් ම—

(අ) ඒවා ඉදිරිපත් කරනු ලබන්නේ සභාවේ යම් රැස්වීමක දී ද ඒ රැස්වීම පවත්වනු ලබන දිනයට යටත් පිරිසෙයින් දින හතකට හෝ පෙරාතුව සාමාජිකයන් අතර බෙද හැරිය යුතු ය ; තව ද

(ආ) එකී රැස්වීම පවත්වනු ලබන දිනයට පෙරාතුව දින හතක්, දිසා කාර්යාලයෙහි හෝ සභාපතිවරයා විසින් නිශ්චය කරනු ලබන වෙනත් යම් ස්ථානයක හෝ මහජනයා විසින් පරීක්ෂා කරනු ලැබීම සඳහා විවෘතව තබනු ලැබිය යුතු අතර, ඒ බවට සභාපතිවරයා විසින් ගැසට් පත්‍රයෙහි ද ඒ සභාව සංස්ථාපනය කරනු ලැබුවේ යම් පරිපාලන දිස්ත්‍රික්කයක් සඳහා ද ඒ පරිපාලන දිස්ත්‍රික්කය ඇතුළත සංසරණය වන ප්‍රවෘත්ති පත්‍ර දෙකක හෝ ඊට වැඩි ගණනක ද දැන්වීමක් කළ යුතු ය.

වාර්ෂික සංවර්ධන සැලැස්ම සහ අය වැය ලේඛනය සංවර්ධන සභාව විසින් සලකා බැලිය යුතු බව.

**41.** මුදල් වර්ෂයේ අවසානයට පෙර කැඳවනු ලබන විශේෂ රැස්වීමක දී සෑම සංවර්ධන සභාවක් විසින් ම, වාර්ෂික සංවර්ධන සැලැස්ම සහ අය වැය ලේඛනය අවසාන වශයෙන් අනුමත කරනු ලැබිය යුතු ය.

පරිපූරක අය වැය ලේඛනය.

**42.** (1) විධායක කමිටුව විසින් ඕනෑම අවස්ථාවක දී, පරිපූරක අය වැය ලේඛනයක් පිළියෙල කොට, එය සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) සෑම පරිපූරක අයවැය ලේඛනයක් ම—

(අ) එය ඉදිරිපත් කරනු ලබන්නේ සභාවේ යම් රැස්වීමක දී ද, ඒ රැස්වීම පවත්වනු ලබන දිනයට යටත් පිරිසෙයින් දින හතකට පෙරාතුව සභිකයන් අතර බෙදා හැරිය යුතු ය ;

(ආ) එකී රැස්වීම පවත්වනු ලබන දිනයට පෙරාතුව දින හතක්, දිසා කාර්යාලයෙහි හෝ සභාපතිවරයා විසින් නිශ්චය කරනු ලබන වෙනත් යම් ස්ථානයක හෝ මහජනයා විසින් පරීක්ෂා කරනු ලැබීම සඳහා විවෘතව තබනු ලැබිය යුතු අතර, ඒ බවට සභාපතිවරයා විසින් ගැසට් පත්‍රයෙහි ද ඒ සභාව සංස්ථාපනය කරනු ලැබුවේ යම් පරිපාලන දිස්ත්‍රික්කයක් සඳහා ද ඒ පරිපාලන දිස්ත්‍රික්කය ඇතුළත සංසරණය වන ප්‍රවෘත්ති පත්‍ර දෙකක හෝ ඊට වැඩි ගණනක ද දැන්වීමක් කළ යුතු ය.

අය වැය ලේඛනය, පරිපූරක අයවැය ලේඛනය සහ වාර්ෂික සංවර්ධන සැලැස්ම සම්බන්ධයෙන් සංවර්ධන සභාවේ බලතල.

43. යම් අයවැය ලේඛනයක හෝ පරිපූරක අයවැය ලේඛනයක නැතහොත් වාර්ෂික සංවර්ධන සැලැස්මෙහි සඳහන් විෂය සියල්ල ම හෝ ඉන් යම් විෂයයක් සංශෝධන සහිතව, හෝ සුළු වශයෙන් වෙනස් කිරීම සහිතව, අනුමත කිරීම නැතහොත් ඒ අයවැය ලේඛනයට, පරිපූරක අයවැය ලේඛනයට හෝ වාර්ෂික සංවර්ධන සැලැස්මට යම් විෂයයක් එකතු කිරීම, සංවර්ධන සභාවක අභිමතය පරිදි කළ හැකි විය යුතු ය.

වාර්ෂික සංවර්ධන සැලැස්ම අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබිය යුතු බව.

44. සංවර්ධන සභාව විසින් 43 වන වගන්තිය යටතේ වාර්ෂික සංවර්ධන සැලැස්ම අනුමත කරනු ලැබීමෙන් පසු සභාව විසින් එය අමාත්‍යවරයා වෙත ඔහුගේ අනුමතය සඳහා ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එසේ අනුමත කරනු ලැබූ විට, ඒ සැලැස්ම, ඒ වර්ෂය සඳහා ඒ සභාවේ වාර්ෂික සංවර්ධන සැලැස්ම බවට පත් විය යුතු ය.

අය වැය ලේඛන මගින් අනුමත කරන ලද වියදම් සඳහා බලය අහෝසි වීම.

45. සංවර්ධන සභාවක් විසින් සම්මත කරන ලද යම් අයවැය ලේඛනයක් හෝ පරිපූරක අයවැය ලේඛනයක් හෝ මගින් මුදල් වියදම් කිරීම සඳහා දෙන ලද බලය, ඒ අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනය හෝ අදාළ වන්නේ යම් මුදල් වර්ෂයක් සම්බන්ධයෙන් ද ඒ මුදල් වර්ෂය අවසානයේ දී අහෝසි විය යුතු ය.

වියදම් අඩු කිරීම හෝ වැඩි කිරීම.

46. අවශ්‍ය අවස්ථාවක, අයවැය ලේඛනයෙහි හෝ යම් පරිපූරක අයවැය ලේඛනයක හෝ යම් ශීර්ෂයක් යටතේ වූ වියදම් අඩු කිරීම හෝ වැඩි කිරීම නැතහොත් එක් වියදම් ශීර්ෂයක් යටතේ වෙන් කරන ලද මුදල් වෙනත් ශීර්ෂයකට මාරු කිරීම සංවර්ධන සභාවක් විසින් යම් වර්ෂයක් තුළ දී කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද සභාව විසින් සම්මත කරනු ලැබූ අයවැය ලේඛනය මගින් හෝ යම් පරිපූරක අයවැය ලේඛනයක් මගින් හෝ අනුමත කරන ලද මුළු වියදම් ප්‍රමාණය ඉක්මවනු නොලැබිය යුතු ය.

## X වන කොටස

## කාර්ය මණ්ඩලය

දිසා සේවාව

47. (1) දිසා සේවාවක් විය යුතු අතර, එය—

(අ) සංවර්ධන සභාවල නිලධරයන්ගෙන් සහ සේවකයන්ගෙන් ද ;

(ආ) 49 වන වගන්තිය යටතේ සභාවට පත් කරනු ලබන වෙනත් නිලධරයන්ගෙන් සහ සේවකයන්ගෙන් ද

සමන්විත විය යුතු ය.

(2) දිසා සේවාවේ සෑම නිලධරයකු ම හෝ සේවකයකු ම ඔහු තත් කාලයෙහි සේවයේ නියුක්තව සිටින සභාවේ විධායක කමිටුවෙහි, විනය පාලනයට හා අධීක්ෂණයට යටත් විය යුතු ය.

(3) කාර්මික ආරාවුල් පනතේ කුමක් සඳහන්ව ඇත ද, දිසා සේවාවේ යම් නිලධරයකුට හෝ සේවකයකුට නැතහොත් යම් නිලධරයකු හෝ සේවකයකු සම්බන්ධයෙන් ඒ පනත අදාළ නොවිය යුතු අතර, 1979 අංක 3 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනතේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ සේවාවේ යම් නිලධරයකුට හෝ සේවකයකුට නැතහොත් යම් නිලධරයකු හෝ සේවකයකු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

දිසා ලේකම්වරයා පත් කිරීම.

48. (1) ජනාධිපතිවරයා විසින්, දිසා අමාත්‍යවරයා විමසා සහ අවශ්‍ය යයි ජනාධිපතිවරයා සලකන අවස්ථාවක සභාවේ සභාපතිවරයා විමසා එක් එක් සංවර්ධන සභාව වෙනුවෙන් දිසා ලේකම්වරයකු පත්කරනු ලැබිය යුතු අතර, ඔහු විසින්, විධායක කමිටුවෙහි විධානවලට යටත්ව, ස්වකීය දිස්ත්‍රික්කයට පත් කරන ලද දිසා සේවාවේ සියලු සාමාජිකයන් විෂයයෙහි අධීක්ෂණය ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(2) දිසා ලේකම්වරයා සභාවේ ප්‍රධාන ගිණුම් නිලධරයා විය යුතු ය.

දිසා සේවාවට වෙනත් සේවාවලින් කාර්ය මණ්ඩලය පත් කිරීම.

49. (1) විධායක කමිටුවෙහි ඉල්ලීම පිට රජයේ සේවයේ යම් නිලධරයකු, ඒ නිලධරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍ය වරයාගේ අමාත්‍යාංශයෙහි ලේකම්වරයාගේ එකඟත්වය ඇතිව, දිසා සේවාවට තාවකාලික ව පත් කරනු ලැබිය හැකි ය; නැතහොත් එසේ ඉල්ලීම පිට හා එවැනිම කැමැත්ත ඇතිව ඒ සේවාවට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(2) රජයේ සේවයේ යම් නිලධරයකු දිසා සේවාවට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 (2) වන වගන්තියෙහි විධිවිධාන ඒ නිලධරයාට සහ ඒ නිලධරයා සම්බන්ධයෙන්, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

(3) රජයේ සේවයේ යම් නිලධරයකු දිසා සේවාවට ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 (3) වන වගන්තියෙහි විධිවිධාන ඒ නිලධරයාට සහ ඒ නිලධරයා සම්බන්ධයෙන්, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

(4) විධායක කමිටුවෙහි ඉල්ලීම පිට, පළාත් පාලන සේවයේ යම් සාමාජිකයකු හෝ පළාත් පාලන ආයතනයක යම් නිලධරයකු නැතහොත් සේවකයකු හෝ, අවස්ථාවෝචිත පරිදි, ඒ සාමාජිකයාගේ, නිලධරයාගේ හෝ සේවකයාගේ සහ පළාත් පාලන සේවා උපදේශක මණ්ඩලයේ හෝ ආයතනයේ සහ පළාත් පාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශ යේ ලේකම්වරයාගේ කැමැත්ත ඇතිව දිසා සේවාවට තාවකාලිකව පත්

කරනු ලැබිය හැකි ය ; නැතහොත් පරිපාලන දිස්ත්‍රික්කය සඳහා සංස්ථාපනය කරන ලද සංවර්ධන සභාව සහ අවස්ථාවෝචිත පරිදි, මණ්ඩලය හෝ ආයතනය හෝ විසින් එකඟවනු ලබන විශ්‍රාම වැටුප්වලට සහ වෙනත් අයිතිවාසිකම්වලට අදාළ නියම හා කොන්දේසි ද ඇතුළුව යම් නියම හා කොන්දේසි මත ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(5) පළාත් පාලන සේවයෙහි යම් සාමාජිකයකු නැතහොත් යම් පළාත් පාලන ආයතනයක යම් නිලධරයකු හෝ සේවකයකු දිසා සේවා වට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, සේවාවෙහි වෙනත් යම් සාමාජිකයකු යටත් වන විනය පාලනයට ම ඒ සාමාජිකයා, නිලධරයා හෝ සේවකයා ද යටත් විය යුතු ය.

## XI වන කොටස

## ගිණුම් සහ ගිවිසුම්

**50.** එක් එක් මුදල් වර්ෂයෙහි අවසානයට පසු හැකි පහසු ඉක්මණින්, ඉකුත් වර්ෂය තුළ දී සභාවේ පරිපාලනය පිළිබඳ විස්තරාත්මක වාර්තා වක්, ඒ වර්ෂය තුළ දී අරමුදල වෙනුවෙන් ලැබීම්වල සහ ගෙවීම්වල ස්වභාවය සහ ප්‍රමාණය දැක්වෙන ප්‍රකාශයක් ද සමඟ, සංවර්ධන සභාවක සභාපතිවරයා විසින් පිළියෙල කරනු ලැබිය යුතු ය. ඒ වාර්තාව සහ ප්‍රකාශය සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, ඒ පිළිබඳව සභාව විසින් සම්මත කරනු ලැබිය හැකි යම් යෝජනා සම්මතයක් ද සමඟ එය, පළමුවෙන් ම සභාව වෙත ඉදිරිපත් කරන ලද දිනයෙහි සිට සති හයක් ඇතුළත අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. *වාර්ෂික පරිපාලන වාර්තාව.*

**51.** ගිණුම් විගණනය කිරීමට අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවෙහි විධිවිධාන, එක් එක් සංවර්ධන සභාවෙහි ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය. *ගිණුම් විගණනය කිරීම.*

**52.** විගණකවරයා විසින්, විගණනය පිළිබඳ තම මාසික වාර්තා සභාව වෙත ඉදිරිපත් කළ යුතු අතර, ඒ විගණනයෙහි වාර්ෂික වාර්තා වක් සභාව වෙත ද ඒ වාර්ෂික වාර්තාවෙහි අනු පිටපතක් මුදල් වර්ෂය අවසන් වීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අමාත්‍යවරයා වෙත ද ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. *විගණකවරයාගේ වාර්තා.*

**53.** (1) සභාව විසින් මුදල් වියදම් කිරීමේ හෝ සභාවට ලැබිය යුතු මුදල් අයකර ගැනීමේ හෝ සභාවේ ගිණුම්වල හෝ කිසියම් සැලකිය යුතු දෝෂයක්, අයෝග්‍යතාවක් නැතහොත් අක්‍රමිකතාවක් සම්බන්ධයෙන් සභාවේ අවධානය යොමු කරවන ලෙස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාව යටතේ පත් කරන ලද විගණකවරයාට හෝ විගණකවරයන්ට අමාත්‍යවරයා විසින් ලියවිල්ලකින් වූ නියමයක් මගින් විධාන කරනු ලැබිය හැකි ය. *ගිණුම්වල අක්‍රමිකතා.*

(2) එවැනි යම් දෝෂයක්, අයෝග්‍යතාවක් හෝ අක්‍රමිකතාවක් සම්බන්ධයෙන් සභාව විසින් ගන්නා ලද හෝ සභාව විසින් ගැනීමට අදහස් කරන හෝ ක්‍රියා මාර්ගය සභාව විසින් හැකිතාක් ඉක්මණින් විගණකවරයා වෙත වාර්තා කළ යුතු ය.

(3) එවැනි වාර්තාවක් සම්බන්ධයෙන්, සුදුසු යයි විගණකවරයා සලකන යම් නියම විගණකවරයා විසින් කරනු ලැබිය හැකි අතර, ඒ නියම අවසානාත්මක විය යුතු ය; තව ද සභාව සහ වෙනත් සියලු තැනැත්තන් විසින් ඒ නියම අනුව ක්‍රියා කළ යුතු ය.

විගණකවරයාට අදාළ සභාවේ බලතල.

54. යම් විගණනයක ප්‍රමාණය, එය කරන ලද ආකාරය නැතහොත් එහි ප්‍රගතිය හා සම්බන්ධ තොරතුරු සපයන ලෙස හෝ යම් විශේෂ විගණනයක් කරන ලෙස හෝ සංවර්ධන සභාවක් විසින්, එහි ගිණුම් විගණකවරයාට කලින් කල නියම කරනු ලැබිය හැකි ය.

විගණකවරයාට පාරිශ්‍රමික ගෙවීම.

55. සෑම සංවර්ධන සභාවක් විසින් ම, එහි ගිණුම් විගණකවරයාගේ සේවය සඳහා සාධාරණ යයි අමාත්‍යවරයා විසින් සහතික කරනු ලබන යම් මුදල් ඒ විගණකවරයාට පාරිශ්‍රමික වශයෙන් කලින් කල අරමුදලෙන් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා වෙත ගෙවනු ලැබිය යුතු ය.

අධිභාර සහ ඒ පිළිබඳ අභියාචනා.

56. (1) මේ පනතින් හෝ වෙනත් යම් ප්‍රඥප්තියකින් හෝ සංවර්ධන සභාවක ගිණුම් විගණකවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ක්‍රියා කරන ඒ විගණකවරයා විසින් සභාවේ ගිණුම්වල නීතියට පටහැනි සෑම විෂයයකට ම අවසර දෙනු නොලැබිය යුතු අතර, ඒ නීති විරෝධී ගෙවීම කරන්නා වූ නැතහොත් එය කිරීමට බලය දෙන්නා වූ, තැනැත්තා කෙරෙහි එය අධිභාරයක් කළ යුතු ය; තව ද යම් තැනැත්තකු ගේ නොසැලකිල්ල හෝ විෂමාචාරය නිසා ඇති වූ යම් ඌනතාවක් හෝ දරන ලද යම් පාඩුවක් ද, ඒ තැනැත්තා ගිණුම් දක්වනු ලැබිය යුතු වුව ද ඔහු විසින් එසේ ගිණුම් දක්වනු නොලැබූ යම් මුදල් ප්‍රමාණයක් ද ඒ තැනැත්තාගෙන් අයකර ගනු ලැබිය යුතු ය; තව ද ඒ එක් එක් අවස්ථාවේ දී ඒ තැනැත්තාගෙන් අයවිය යුතු මුදල සහතික කර, තම තීරණය දිසා ලේකම්වරයා මගින් ඒ තැනැත්තා වෙත ලියවිල්ලකින් දැනුම් දෙනු ලැබිය යුතු ය :

එසේ වුව ද සභාව විසින් දරන ලද කිසිම වියදමක් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබ ඇත්නම්, එවැනි විගණකවරයකු විසින් ඒ වියදම සඳහා අවසර නොදීම නොකළ යුතු ය.

(2) යම් තැනැත්තකුට විරුද්ධව අවසර නොදීමක් හෝ අධිභාරයක් හෝ කිරීමට පෙර විගණකවරයා විසින් ඒ කාරණය සම්බන්ධයෙන් සුදුසු යයි විගණකවරයා කල්පනා කරන ආකාරයට කරුණු කියා පෑමට හෝ කරුණු ඉදිරිපත් කිරීමට හෝ ඒ තැනැත්තාට අවස්ථාවක් ලබාදිය යුතු ය ; තව ද විගණකවරයා විසින්, එවැනි අවසර නොදීමක් නැතහොත් අධිභාරයක් කරනු ලැබුවහොත්, ඒ අවසර නොදීම හෝ අධිභාරය හෝ සම්බන්ධයෙන් ස්වකීය තීරණය සඳහා හේතු දක්වන ලෙස ඉල්ලීමක් කරනු ලැබූ විට, ඒ හේතු ලියවිල්ලකින් ඒ තැනැත්තා වෙත සැපයිය යුතු ය.

(3) එවැනි යම් අවසර නොදීමක් හෝ අධිභාරයක් හෝ නිසා අතෘප්ති යට පත් යම් තැනැත්තකු විසින් ඒ සම්බන්ධයෙන් අභියාචනාධිකරණය වෙත අභියාචනයක් කරනු ලැබිය හැකි අතර, අභියාචනාධිකරණය

විසින්, ඒ අවසර නොදීම හෝ අධිභාරය හෝ ස්ථිර කරනු ලැබිය හැකි ය ; නැතහොත් ඒ අවසර නොදීම හෝ අධිභාරය නීතියට අනුකූලව කර නොමැති බව අභියාචනාධිකරණය විසින් තීරණය කරනු ලැබුවහොත් ඒ අනුව ඒ අවසර නොදීම හෝ අධිභාරය අභියාචනාධිකරණය විසින් සුළු වශයෙන් වෙනස් කරනු ලැබිය හැකි ය; එසේ නැතහොත් නිෂ්ප්‍රභ කරනු ලැබිය හැකි ය. මේ උපවගන්තිය යටතේ වූ සෑම අභියාචන යක් ම, දිසා අධිකරණයේ අතුරු ආඥාවලට විරුද්ධව ඉදිරිපත් කරනු ලබන අභියාචනවලට අදාළව නියමිත රීති මගින් නියම කරන ලද කාලය ඇතුළත හා නියම කරන ලද ආකාරය අනුව සහ ඒ රීතිවලට යටත්ව ඉදිරිපත් කිරීම ද, නඩු කටයුතු මෙහෙයවීම ද, ක්‍රියාවේ යෙදවීම ද කරනු ලැබිය යුතු ය. ඒ සම්බන්ධයෙන් වූ සියලු නඩු කටයුතු දිසා අධිකරණයෙන් ඉදිරිපත් කරනු ලබන අභියාචන යටත් වන මුද්දර ගාස්තුවලට ම යටත් විය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ වූ අභියාචනයක් වෙනුවට, අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, තමා වෙත යථා පරිදි දන්වන ලද විගණකවරයාගේ තීරණයෙහි දිනයෙහි සිට දින තිහක් ඇතුළත දී ඒ තීරණයට විරුද්ධව අමාත්‍යවරයා වෙත අභියාචනය කරනු ලැබිය හැකි ය :

එසේ වුව ද ඒ අවසරය නොදීමේ නැතහොත් අධිභාරයේ කාරණය සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කිරීමට (2) වන උපවගන්තියේ විධිවිධාන අනුව විගණකවරයා විසින් අවස්ථාවක් ලබා දීමෙන් පසු අභියාචක විසින් එසේ කරුණු ඉදිරිපත් කිරීම පැහැර හරින ලද හෝ නොසලකා හරින ලද හෝ කවර හෝ විටක එවැනි කිසිම අභියාචනයක් භාර ගනු නොලැබිය යුතු ය.

(5) (4) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා වෙත අභියාචනයක් කරනු ලැබූ විට, අමාත්‍යවරයා විසින් කාරණයේ කුසලතා අනුව එය තීරණය කරනු ලැබිය යුතු අතර, එසේ අවසර නොදෙන ලද හෝ අධිභාර කරන ලද හෝ මුළු මුදල නැතහොත් ඉන් යම් කොටසක් අභියාචක ගෙන් අයකර ගැනීම සුදුසු යයි අමාත්‍යවරයා කල්පනා කරන්නේ නම් එසේ අයකර ගන්නා ලෙස ඔහු විසින් නියමයක් මගින් විධාන කරනු ලැබිය හැකි ය ; තව ද යම් අවසර නොදීමක් හෝ අධිභාරයක් නීත්‍යානු කූලව කර ඇත ද, එයට විෂය වූ කාරණය සිද්ධව ඇත්තේ අවසර නොදුන් මුදල හෝ අධිභාරය ප්‍රේෂණය කිරීම සාධාරණ සහ යුක්ති සහගත කරන යම් අවස්ථානුගත කරුණු යටතේ බව අමාත්‍යවරයාට පෙනී ගියහොත් එය ප්‍රේෂණය කරන ලෙස අමාත්‍යවරයා විසින් නියමයක් මගින් විධාන කරනු ලැබිය හැකි ය; එසේ වුවත්, ඒ අවසර නොදීම හෝ අධිභාරය නැතහොත් එහි යම් කොටසක් ක්‍රියාත්මක කිරීමේ දී විගණකවරයා විසින් දරන ලද පිරිවැය සහ වියදම් ප්‍රමාණය ඒ තැනැත්තා ගෙන් අය කර ගනු ලැබිය යුතු ය.

(6) මේ වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් කරන ලද යම් නියම යක් මගින්, එවැනි යම් තැනැත්තකුගෙන් අයකර ගන්නා ලෙස, විධාන කරන ලද යම් මුදලක්, අය විය යුතු ලෙස විගණකවරයා විසින් සහතික කරන ලද යම් මුදලක් මේ වගන්තියේ විධිවිධාන යටතේ අයකර ගනු ලබන ආකාරයෙන් ම, දිසා ලේකම්වරයා විසින් නොපමාව අයකර ගනු ලැබිය හැකි ය.

(7) යම් තැනැත්තකුගෙන් අය විය යුතු ලෙස යම් විගණකවරයකු විසින් පෙර කී පරිදි සහතික කරන ලද සෑම මුදලක් ම, තීරණයට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කර ඇත්නම් මිස, ඒ තැනැත්තා විසින්, විගණකවරයාගේ තීරණය ඒ තැනැත්තා වෙත දන්වා යවනු ලැබීමෙන් පසු දින දහ හතරක් ඇතුළත දිසා ලේකම්වරයා වෙත ගෙවනු ලැබිය යුතු ය. ඒ මුදල ගෙවනු නොලැබුවේ නම් සහ එවැනි අභියාචනයක් ඉදිරිපත් කර නොමැති නම්, ඒ මුදල ඒ තැනැත්තාගෙන් අයකර ගැනීම දිසා ලේකම්වරයාගේ කාර්යය විය යුතු ය. අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයකු වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, එසේ සහතික කරන ලද යම් මුදලක්, එය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් දරන ලද සියලු ගාස්තු සහ වියදම් ද සමග, ඒ මහෙස්ත්‍රාත්වරයා විසින් නියම කරන ලද දඩයක් අයකර ගනු ලබන ආකාරයෙන් ම අයකර ගනු ලැබිය හැකි ය.

රුපියල් පන්දහසක් නොඉක්මවන වියදමක් ඇතුළත් ගිවිසුම.

57. රුපියල් පන් දහසකට වැඩි නොවන ඇස්තමේන්තු කරන ලද වියදමක් ඇතුළත්, යම් වැඩක් හෝ සේවාවක් ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම සඳහා නැතහොත් යම් භාණ්ඩ හෝ ද්‍රව්‍ය සැපයීම සඳහා වූ යම් ගිවිසුමක් එක් අවුරුද්දකට වැඩි කාලයක් නොපවතී නම් හෝ එසේ පවතී යයි අපේක්ෂා කරනු නොලබන්නේ නම් ද අනුමත කරන ලද අයවැය ලේඛනයක් මගින් හෝ පරිපූරක අයවැය ලේඛනයක් මගින් හෝ ඒ සඳහා අවශ්‍ය මුදල් සලසා ඇත්නම් ද දිසා ලේකම්වරයා විසින් සභාව වෙනුවෙන් එවැනි ගිවිසුමකට ඇතුළත් විය හැකි ය.

රුපියල් පන්දහසක් ඉක්මවන වියදමක් ඇතුළත් ගිවිසුම.

58. රුපියල් පන් දහසකට වැඩි ඇස්තමේන්තු කරන ලද වියදමක් ඇතුළත්, සංවර්ධන සභාවක් සඳහා වූ යම් වැඩක් හෝ සේවාවක් ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම සඳහා නැතහොත් යම් භාණ්ඩ හෝ ද්‍රව්‍ය සැපයීම සඳහා වූ යම් ගිවිසුමකට නැතහොත් එක් අවුරුද්දකට වැඩි කාලයක් පවතින හෝ පවතී යයි අපේක්ෂා කරනු ලබන යම් ගිවිසුමකට ශ්‍රී ලංකාවේ දී ඇතුළත් වන්නේ නම් එය ලියවිල්ලකින් විය යුතු අතර, සභාව වෙනුවෙන් සභාපතිවරයා සහ දිසා ලේකම්වරයා ඊට අත්සන් තැබිය යුතු ය; තව ද සභාවේ පොදු මුද්‍රාවෙන් එය මුද්‍රා කර තිබිය යුතු අතර, එවැනි යම් ගිවිසුමක ඇතුළත් කිරීම අවශ්‍ය යයි සලකනු ලබන වෙනත් යම් කාරණාවලට අතිරේකව—

(අ) ක්‍රියාත්මක කළ යුතු හෝ ඉටු කළ යුතු වැඩ හෝ සේවා හෝ සැපයිය යුතු ද්‍රව්‍ය හෝ භාණ්ඩ ;

(ආ) වැඩ, සේවා, ද්‍රව්‍ය හෝ භාණ්ඩ සඳහා ගෙවිය යුතු මිල හෝ ගාස්තු ප්‍රමාණය ;

(ඇ) වැඩ හෝ සේවා නිම කළ යුතු නැතහොත් ද්‍රව්‍ය හෝ භාණ්ඩ සැපයිය යුතු කාලය නැතහොත් කාලසීමා ; සහ

(ඈ) කඩකිරීම්වල දී නියම කරනු ලැබිය යුතු යම් දණ්ඩනයක් හෝ දණ්ඩන

එහි සඳහන් විය යුතු ය.

සභාවේ ගිවිසුම් කෙරෙහි නිලධරයන් හා සේවකයන් සම්බන්ධතාවක් නොදැක්විය යුතු බව.

59. සංවර්ධන සභාවක් සමග හෝ සඳහා ඇතිකර ගත් හෝ කරන ලද යම් ගිවිසුමක් හෝ වැඩක් කෙරෙහි කෙළින් ම හෝ අන් අයුරකින් යම් ප්‍රවේදිතාවක් හෝ සම්බන්ධතාවක් ඇති සභාවේ යම් නිලධරයකු හෝ සේවකයකු ස්වකීය ධුරයෙන් හෝ සේවානියුක්තියෙන් පහ කරනු ලැබීමට යටත් විය යුතු ය ; තව ද ඔහුගේ ප්‍රවේදිතාව හෝ සම්බන්ධතාව බද්ධ ව්‍යාපාරවස්තු සමාගමක කොටස්කරුවකු වශයෙන් නොව,

අනාථාකාරයකින් වේ නම්, ඔහු වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන්සියයක් නො ඉක්මවන දඩ යකට ඔහු යටත් විය යුතු ය.

**60.** 58 වන වගන්තියෙහි සඳහන් පරිදි වූ යම් ගිවිසුමකට ඇතුළත් වීමට පෙර— ටෙන්ඩර්.

(අ) ගිවිසුම යථා පරිදි ඉටු කරනු ලැබීම පිණිස ප්‍රමාණවත් ඇපයක් ගත යුතු යයි සභාව විධාන කළහොත් දිසා ලේකම්වරයා විසින් ඒ ඇපය ගනු ලැබිය යුතු ය ;

(ආ) කිසියම් විශේෂ කාරණයක දී සභාවේ යෝජනා සම්මතයක් මගින් අනාථාකාරයකින් බලය දී ඇත්නම් මිස, දිසා ලේකම් වරයා විසින් දැන්වීමක් මගින් ටෙන්ඩර් කැඳවනු ලැබිය යුතු ය ;

(ඇ) ටෙන්ඩර් සඳහා වූ ආරාධනා ද ටෙන්ඩර් කිසිවක් වේ නම් ඒවා හෝ ඒවායේ පිටපත් ද සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, සභාව විසින් ඒ ටෙන්ඩර් අතුරින් එකක් පිළිගනු ලැබිය යුතු ය ; නැතහොත් ඒවා සියල්ලම ප්‍රතික්ෂේප කරනු ලැබිය යුතු ය ; තව ද

(ඈ) අනුමත අයවැය ලේඛනයක නැතහොත් පරිපූරක අයවැය ලේඛනයක ගිවිසුම සඳහා අවශ්‍ය මුදල් සලසා දී ඇති බවට සභාව සෑහීමට පත් වීමෙන් පසුව, සභාව විසින් ගිවිසුම අනුමත කළ යුතු ය.

## XII වන කොටස

### පොදු පාලනය

**61.** (1) ආණ්ඩුවේ පොදු ප්‍රතිපත්තිය යම් දිස්ත්‍රික්කයකට අදාළ කර ගැනීම සම්බන්ධයෙන් දිසා අමාත්‍යවරයාත්, පරිපාලන දිස්ත්‍රික්කයක් සඳහා සංස්ථාපිත සංවර්ධන සභාවේ විධායක කමිටුවත් අතර යම් මතභේදයක් ඇති වූ අවස්ථාවක, ඒ මතභේදය පිළිබඳව ජනාධිපතිවරයාට දැනුම්දීම ඒ දිසා අමාත්‍යවරයාගේ යුතුකම විය යුතු ය.

දිසා අමාත්‍යවරයාත් කමිටුවත් අතර මත භේදයක් ඇතිවුවහොත් එය ජනාධිපතිවරයාට දැනුම් දීම දිසා අමාත්‍යවරයාගේ යුතුකම බව.

(2) දිසා අමාත්‍යවරයකු හා ඒ පරිපාලන දිස්ත්‍රික්කය සඳහා සංස්ථාපිත සංවර්ධන සභාවේ විධායක කමිටුව අතර ඇති වි ඇති ඒ මතභේද සමථයකට පත් කළනොහැකි බව ජනාධිපතිවරයාට පෙනී යන්නේ නම්, ජනාධිපතිවරයා විසින් ඒ විධායක කමිටුව විසුරුවා හරිනු ලැබිය හැකි ය.

(3) යම් පරිපාලන දිස්ත්‍රික්කයක් සඳහා සංස්ථාපිත සංවර්ධන සභාවක විධායක කමිටුව (2) වන උපවගන්තියෙන් තමා වෙත පැවරුණු බලතල ප්‍රකාර ජනාධිපතිවරයා විසින් විසුරුවා හරිනු ලැබූ අවස්ථාවක, දිසා අමාත්‍යවරයා විසින් ජනාධිපතිවරයාගේ එකඟත්වය ඇතිව 31 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි අතුරු වගන්තිය අනුව නව විධායක කමිටුවක් පත් කළ යුතු ය.

විධායක කමිටුවේ සාමාජිකයන් ඉවත් කිරීමට ජනාධිපතිවරයාට බලය ඇති බව.

62. (1) යම් විධායක කමිටුවක සියලු සාමාජිකයන්ගේ හෝ ඔවුන් අතුරින් යම් සාමාජිකයකුගේ හෝ අකාර්යක්ෂමතාව හෝ නොමනා පාලනය හෝ පිළිබඳව ප්‍රමාණවත් සාක්ෂි ඇති බවට ජනාධිපතිවරයා සෑහීමට පත් වුවහොත් ඒ එක් එක් අවස්ථාවට අදාළ කරුණු අනුව අවශ්‍ය වන්නේ නම් ජනාධිපතිවරයා විසින්, කරුණු කියා සිටීමට ඒ සාමාජිකයාට හෝ සාමාජිකයන්ට අවස්ථාවක් සලසා දීමෙන් පසු, ඒ සාමාජිකයා හෝ සාමාජිකයන් ගැසට් පත්‍රයේ පළ කරන නියමයක් මගින් ධුරයෙන් ඉවත් කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් සාමාජිකයකු ඉවත් කරනු ලැබූ අවස්ථාවක, එසේ ඉවත් කරනු ලැබූ සාමාජිකයා වෙනුවට, දිසා අමාත්‍යවරයා විසින් සභාපතිවරයා විමසා වෙනත් සාමාජිකයකු පත් කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද සභාවේ සභාපතිවරයා (1) වන උපවගන්තිය යටතේ ඉවත් කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ සභාපතිවරයා විමසීම අවශ්‍ය නොවන්නේ ය.

සංවර්ධන සභාව විසුරුවා හැරීම.

63. (1) යම් සංවර්ධන සභාවක සභාපතිවරයා සම්බන්ධයෙන් හෝ යම් සංවර්ධන සභාවක හෝ යම් සංවර්ධන සභාවක යම් සභිකයකු සම්බන්ධයෙන් හෝ—

(අ) අකාර්යක්ෂමතාව සහ නොමනා පාලනය ; හෝ

(ආ) මේ පනතින් නියම කරන ලද කාර්ය ඉටු කිරීම නිරතුරුව පැහැර හැරීම ; හෝ

(ඇ) නීතියේ යම් විධිවිධාන අනුව ක්‍රියා කිරීම නිරතුරුව ප්‍රතික්ෂේප කිරීම හෝ නොසලකා හැරීම ; හෝ

(ඈ) මේ පනතින් පැවරුණු බලතල අනිසි ලෙස පාවිච්චි කිරීම ; හෝ

(ඉ) රැස්වීම් පැවැත්වීම හෝ රැස්වීම්වලට පැමිණීම හෝ පැවැත්වෙන රැස්වීම්වල දී ඡන්දය දීම හෝ පැවැත්වෙන රැස්වීම්වල කටයුතු කිරීම නිරතුරුව ප්‍රතික්ෂේප කිරීම

ගැන ප්‍රමාණවත් සාක්ෂි ඇති බවට කවර වූ හෝ අවස්ථාවක අමාත්‍යවරයා සෑහීමට පත් වන්නේ නම් ඒ එක් එක් අවස්ථාවට අදාළ කරුණු අනුව, අවශ්‍ය වන පරිදි, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, අමාත්‍යවරයා විසින්—

(i) සභාපතිවරයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය ; නැතහොත්

(ii) සභාවේ තෝරා පත් කර ගන්නා ලද සියලුම සභිකයන් හෝ ඔවුන් අතුරින් යම් සභිකයකු හෝ ඉවත් කරනු ලැබිය හැකි ය.

තව ද ඒ නියමය හැකිතාක් ඉක්මනින් පාර්ලිමේන්තුව ඉදිරියෙහි තැබිය යුතු ය.

(2) අමාත්‍යවරයා විසින්, (1) වන උපවගන්තිය යටතේ නියමයක් කිරීමට පෙර, (1) වන උපවගන්තියෙහි සඳහන් යම් කාරණයක් සම්බන්ධයෙන් තමා සෑහීමට පත් වනු පිණිස, ඒ කාරණය ගැන මාස තුනක් වූ කාලසීමාවක් ඇතුළත පරීක්ෂා කොට වාර්තා කිරීම සඳහා විශ්‍රාම ලත් අධිකරණ නිලධරයකු පත් කළ යුතු ය. එසේ පත් කරන ලද තැනැත්තාට, ඒ පරීක්ෂණයට අදාළව, පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ පත් කරන ලද පරීක්ෂණ කොමිෂන් සභාවක බලතල තිබිය යුතු ය.

(3) (අ) යම් කාරණයක් ගැන පරීක්ෂා කිරීම සඳහා අමාත්‍යවරයා විසින්, (2) වන උපවගන්තිය යටතේ විශ්‍රාම ලත් අධිකරණ නිලධරයකු පත් කරනු ලබන විටක, අවස්ථාවට අදාළ කරුණු අනුව අවශ්‍ය වියහැකි පරිදි, අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින්—

(i) සභාපතිවරයා විසින් ධුරයෙහි කාර්ය ඉටු කිරීම තාවකාලිකව අත්හිටුවා සභාපතිවරයාගේ බලතල ක්‍රියාත්මක කිරීමටත් ඔහුගේ කාර්ය ඉටු කිරීමටත් දිසා ලේකම්වරයාට විධාන කළ හැකි ය ; නැතහොත්

(ii) තෝරා පත් කර ගන්නා ලද සියලුම සභිකයන් හෝ ඔවුන් අතුරින් යම් සභිකයකු හෝ විසින් ස්වකීය ධුරයෙහි කාර්ය ඉටු කිරීම තාවකාලිකව අත්හිටවනු ලැබිය හැකි අතර, තෝරා පත් කර ගන්නා ලද සියලුම සභිකයන් ධුරයෙහි කාර්ය ඉටු කිරීම අමාත්‍යවරයා විසින් තාවකාලිකව අත්හිටවනු ලැබූ අවස්ථාවක සභාවේ සහ එහි සභාපතිවරයාගේ බලතල ක්‍රියාත්මක කිරීමටත් කාර්ය ඉටු කිරීමටත් දිසා ලේකම් වරයාට විධාන කළ හැකි ය. ඉනික්බිතිව අනෙකුත් සභිකයන් කර්තව්‍ය ඉටු කිරීම නතර විය යුතු ය.

(ආ) (2) වන උපවගන්තිය යටතේ පත් කරන ලද තැනැත්තාගේ වාර්තාව ලැබුණු විට අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තිය යටතේ නියමයක් කළ හැකි ය ; නැතහොත් මේ උපවගන්තියේ (අ) ඡේදය යටතේ කරන ලද නියමය ප්‍රත්‍යාදිෂ්ට කළ හැකි ය.

(4) අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තිය යටතේ වූ නියමයක් මගින් සංවර්ධන සභාවක සභාපතිවරයා ධුරයෙන් ඉවත් කරනලද අවස්ථාවක, සභාපතිවරයා ඒ සභාවේ සභිකයකුව සිටීම ද අවසන් විය යුතු ය.

(5) සංවර්ධන සභාවක තෝරා පත් කර ගන්නා ලද සියලුම සභිකයන් (1) වන උපවගන්තිය යටතේ ඉවත් කරනු ලැබූ අවස්ථාවක, අනෙක් සභිකයන් විසින් කර්තව්‍ය ඉටු කිරීම නතර විය යුතු අතර—

(අ) මේ පනතින් හෝ වෙනත් ලිඛිත නීතියකින් හෝ සභාව වෙත පවරන ලද හෝ නියම කරන ලද හෝ වෙන් කර දෙන ලද බලතල, කාර්ය හා කර්තව්‍ය දිසා අමාත්‍යවරයා විසින් ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කළ යුතු ය ; නැතහොත්

(ආ) සභාවේ අලුත් සභිකයන් තෝරා පත් කර ගැනීම පිණිස ඡන්ද විමසීමක් පවත්වන ලෙස ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින්, අමාත්‍යවරයා විසින් කවර හෝ වේලාවක විධාන කරනු ලැබිය හැකි අතර, 4 වන වගන්තියේ විධිවිධාන වල කුමක් සඳහන්ව ඇත ද, ඒ සභිකයන්, අවුරුදු හතරක කාල සීමාවක් සඳහා ස්වකීය ධුර දැරිය යුතු ය.

64. සභාවේ කටයුතු වාර්තාවලින් හෝ සභාවේ යම් විශේෂ කමිටුවක කටයුතු වාර්තාවලින් යම් උද්ධෘතයක් තමා වෙත සපයන ලෙස අමාත්‍යවරයා විසින් යම් සංවර්ධන සභාවකට ලිඛිත නියමයකින් නියම කළ හැකි අතර, සභාව විසින් අසාධාරණ ප්‍රමාදයකින් තොරව ඒ නියමයේ නියම අනුව ක්‍රියා කළ යුතු ය.

කටයුතු වාර්තාවලින් උද්ධෘත ඉල්ලා සිටීමට අමාත්‍යවරයාට ඇති බලය.

වාර වාර්තා ආදිය ඉල්ලා සිටීමට අමාත්‍ය වරයාට ඇති බලය.

**65.** යම් සංවර්ධන සභාවක වැඩ කටයුතු, ආදායම හා වියදම සම්බන්ධ යෙන් සුදුසු යයි අමාත්‍යවරයා සලකන වාර වාර්තා, තොරතුරු හා සංඛ්‍යා ලේඛන සියලු අවස්ථාවල දී ඔහු විසින් ඉල්ලා සිටිනු ලැබිය හැකි ය; තව ද සභාව විසින් අසාධාරණ ප්‍රමාදයකින් තොරව ඒ දැන්වීමේ නියම අනුව ක්‍රියා කළ යුතු ය.

පරීක්ෂණ පැවැත්වීමට අමාත්‍යවරයාට ඇති බලය .

**66.** මේ පනතින් හෝ වෙනත් යම් ලිඛිත නීතියකින් යම් සංවර්ධන සභා වක් වෙත නියම වී ඇති යම් කාර්යයක් ඉටුකිරීම හෝ වැඩක් කිරීම ඒ සභාව විසින් නොකර හරින බව අමාත්‍යවරයාට යම් වේලාවක පෙනී ගිය හොත්, දින පහළොවක් ඇතුළත සභාව පටහැනිව හේතු දක්වන්නේ නම් මිස, ඒ නොකර හැරීම පිළිබඳව කරුණු පරීක්ෂා කොට තමා වෙත වාර්තා කිරීම පිණිස ද ඒ කාර්යය ඉටු කිරීමේ හෝ වැඩය කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය යයි තමා කල්පනා කරන පියවර නිර්දේශ කිරීම පිණිස ද විශේෂ නිලධර යකු අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන බව අමාත්‍යවරයා විසින් සභාවට දැන්විය හැකි ය. ඒ පරීක්ෂණය හැකිතාක් දුරට විවෘත ස්වභාව යකින් පැවැත්විය යුතු ය.

අවශ්‍ය වැඩ කරන ලෙස සභාවට නියම කිරීමට අමාත්‍යවරයාට ඇති බලය.

**67.** 66 වන වගන්තිය යටතේ පත් කරන ලද නිලධරයාගේ වාර්තාව ලැබුණු විට, කවර කාර්යයක් හෝ වැඩක් ඉටු කරනු ලැබිය යුතු ද නැත හොත් කරනු ලැබිය යුතු ද යන වග අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි අතර, සභාව වෙත කරනු ලබන නියමයක් මගින්, ඒ නියම යෙහි සඳහන් කරනු ලබන කාලයක් ඇතුළත, ඒ කාර්යය ඉටු කරන ලෙස හෝ ඒ වැඩය කරන ලෙස සභාවට නියම කරනු ලැබිය හැකිය.

නියමය බලාත්මක කිරීමට ඇති බලය.

**68.** 67 වන වගන්තිය යටතේ කරන ලද නියමයෙහි සඳහන් කාලය ඇතුළත, ඒ නියමය අනුව ක්‍රියා කිරීම යම් සංවර්ධන සභාවක් විසින් පැහැර හරිනු ලැබූ අවස්ථාවක, ඒ කාර්යය ඉටු කරන ලෙස හෝ ඒ වැඩය කරන ලෙස අමාත්‍යවරයා විසින් දිසා අමාත්‍යවරයාට විධාන කරනු ලැබිය හැකි ය; නැතහොත් ඒ කාර්යය ඉටු කිරීම හෝ ඒ වැඩය කිරීම පිණිස වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි අතර ඒ තැනැත්තාට ගෙවනු ලැබිය යුතු පාරිශ්‍රමිකය නියම කළ හැකි ය; තව ද ඒ පාරිශ්‍රමිකය සහ ඒ වැඩය සඳහා වූ වියදම අරමුදලෙන් දරනු ලැබිය යුතු යයි අමාත්‍ය වරයා විසින් විධාන කරනු ලැබිය හැකි ය.

## XIII වන කොටස

### අතුරු ව්‍යවස්ථා

අතුරු ව්‍යවස්ථා සෑදීමට ඇති බලය.

**69.** (1) මේ පනත යටතේ සභාව වෙත පැවරී ඇති බලතල සහ කාර්ය ක්‍රියාත්මක කිරීමේ සහ වාර්ෂික සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය යයි පෙනී යන අතුරු ව්‍යවස්ථා කලින් කල සෑදීම ද සාදනු ලැබූ පසු ප්‍රත්‍යාදිෂ්ට කිරීම නැතහොත් සංශෝධනය කිරීම ද සෑම සංවර්ධන සභාවක් විසින් ම කළ හැකි ය.

(2) (1) වන උපවගන්තියෙන් පැවරුනු බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, සංවර්ධන සභාවක් විසින් සාදනු ලබන අතුරු ව්‍යවස්ථාවලින්, මේ පනත යටතේ වූ හෝ යම් ලිඛිත නීතියක් යටතේ වූ සභාවේ බලතල, කර්තව්‍ය සහ කාර්ය ක්‍රියාත්මක කිරීමේ සහ ඉටු කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය සියලු කාරණා සඳහා විධිවිධාන සැලැස්විය හැකි ය.

(3) සංවර්ධන සභාවක් විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථාවක් සම්බන්ධයෙන් වූ සෑම කඩකිරීමක් ම, මේ පනත යටතේ වරදක් වන අතර ඒ වරද—

(අ) ප්‍රථම වරට කරන ලද වරදක් වූ විට රුපියල් එක් සියයක් නොඉක්මවන දඩයකින් ද ;

(ආ) දෙවන වරට හෝ තදනන්තරව කරන ලද වරදක් වූ විට රුපියල් දෙසියයක් නොඉක්මවන දඩයකින් ද ;

(ඇ) නොකඩව කරගෙන යන වරදක් වූ විට, වරදකරු කරනු ලැබීමකින් පසු හෝ ඒ කඩකිරීම සම්බන්ධයෙන් අවධානය යොමු කරවමින් සභාපතිවරයාගෙන් ලිඛිත දැන්වීමක් භාරදෙනු ලැබීමෙන් පසු ඒ වරද නොකඩව කරගෙන යන සෑම දිනයක් සඳහා ම රුපියල් විසිපහක් නොඉක්මවන අතිරේක දඩයකින් ද

ඒ වරද සඳහා දඬුවම් කරනු ලැබිය යුතු ය.

අතුරු ව්‍යවස්ථා ස්ථිර කිරීම සහ පළ කිරීම.

70. (1) කිසිම අතුරු ව්‍යවස්ථාවක්, පාර්ලිමේන්තුව විසින් ස්ථිර කරනු ලැබ, ඒ ස්ථිර කිරීම පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලබන තෙක් බලාත්මක නොවිය යුතු ය.

(2) ඒ ස්ථිර කිරීම පිළිබඳ නිවේදනයෙන් පසු, සෑම අතුරු ව්‍යවස්ථාවක් ම, එය මෙහි ලා පැනවූවක් සේ වලංගු හා බලසහිත විය යුතු ය.

නියෝග.

71. (1) නියම කිරීමට මේ පනතින් ප්‍රකාශිත හෝ නියමිත නැතහොත් නියෝග සාදනු ලැබීමට මේ පනතින් නියමිත හෝ බලය දී ඇති සියලු කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකි ය.

(2) මේ පනත යටතේ සාදන ලද කිසිම නියෝගයක්, එය පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලැබ, ඒ අනුමත කිරීම පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලබන තෙක් බලාත්මක නොවිය යුතු ය.

(3) මේ පනත යටතේ සාදන ලද සෑම නියෝගයක් ම, ඒ අනුමත කිරීම පිළිබඳ නිවේදනයෙන් පසු, එය මෙහි ලා පැනවූවක් සේ වලංගු හා බල සහිත විය යුතු ය.

අතුරු ව්‍යවස්ථාවල සහ නියෝගවල පිටපත් ලබාගත හැකි විය යුතු බව.

72. සංවර්ධන සභාවක් විසින් සාදන ලද සියලු අතුරු ව්‍යවස්ථාවල ද ඒ සම්බන්ධයෙන් සාදන ලද සියලු නියෝගවල ද පිටපත් දිසා කාර්යාලයේ තැබිය යුතු අතර ඒවා මහජනයා විසින් පරීක්ෂා කරනු ලැබීම සඳහා හෝ මහජනයාට විකිණීම සඳහා හෝ ඉඩ සලසා තිබිය යුතු ය.

## XIV වන කොටස

### පොදු විධිවිධාන

සංවර්ධන සභා විසින් ගිවිසුම්වලට ඇතුළත් විය හැකි බව.

73. (1) සංවර්ධන සභාවක කර්තව්‍ය අතුරින් යම් කර්තව්‍යයක් ඉටු කිරීම සඳහා අවශ්‍ය යම් ගිවිසුමකට ඒ සභාව විසින් ඇතුළත් විය හැකි ය.

(2) සංවර්ධන සභාවක් සමඟ ගිවිසුමකට ඇතුළත් වන තැනැත්තකු, ඒ සම්බන්ධයෙන් අදාළ වන යම් ලිඛිත නීතියකට අනුකූලව ක්‍රියා කරනු ලැබ ඇද්ද යනු විමසීමට බැඳී නැති අතර, එකී ලිඛිත නීතියට අනුව ක්‍රියා කරනු ලැබ නොතිබුණ ද, සභාව විසින් ඇතුළත් වූ සියලු ගිවිසුම්, අන්‍යාකාරයකින් වලංගු නම්, පූර්ණ බල සහිත හා ඵල සහිත විය යුතු ය.

වංචා වැළැක්වීමේ ආඥාපනත අදාළ නොවිය යුතු බව.

74. නිශ්චල දේපළ කෙරෙහි බලපාන්නා වූ ද සංවර්ධන සභාවක් පාර්ශ්වකරුවකු වන්නා වූ ද යම් විකිණීමකට, බද්දකට, උකසකට, නිදහස් කිරීමකට හෝ වෙනත් එකඟවීමකට හෝ ගිවිසුමකට වංචා වැළැක්වීමේ ආඥාපනතේ කිසිම විධිවිධානයක් අදාළ නොවිය යුතු ය.

බදු අයකර ගැනීම.

75. (1) මේ පනත යටතේ නියම කරන ලද යම් බද්දක මුදල සංවර්ධන සභාව විසින් විධාන කරනු ලබන කාලය ඇතුළත දිසා කාර්යාලයට ගෙවනු නොලැබුවහොත්, ඒ බද්ද සහ ඒ බද්ද අය කර ගැනීමේ වියදම්, ඒ බද්ද අය විය යුතු වන්නේ යම් දේපළක් සම්බන්ධ යෙන් ද ඒ දේපළ සහ ගෙවීම පැහැර හැරිය තැනැත්තාගේ සියලු චංචල හෝ නිශ්චල දේපළ තහනමට ගෙන විකිණීමෙන් අය කර ගැනීමට බල පත්‍රයේ නම් කරනු ලබන යම් බදු එකතු කරන්නකුට හෝ සභාවේ වෙනත් නිලධරයකුට විධාන කෙරෙන්නා වූ ද දිසා ලේකම්වරයා විසින් අත්සන් කරන ලද්ද වූ ද බලපත්‍රයක් ඒ බදු එකතුකරන්නාට හෝ නිලධරයාට නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලබන සෑම බල පත්‍රයක්ම, මේ පනත යටතේ සෑදීමට මෙයින් සභාවට බලය දී ඇති අතුරු ව්‍යවස්ථා මගින් නියම කරනු ලබන යම් ආකෘතියක විය යුතු ය.

(3) අත්හැරීමට ඇති මුදල් ප්‍රමාණය ඉතා සුළු බව හෝ අය කර ගත නොහැකි බව හෝ එය ගෙවීමට යටත් තැනැත්තා දිළිඳුවීමේ හේතුවෙන් එය කපා හැරිය යුතු බව සංවර්ධන සභාවකට පෙනී යන්නේ නම්, යම් බදු මුදලක් සම්පූර්ණයෙන් ම හෝ එහි යම් කොටසක් සහ ඒ බදු මුදල අය කර ගැනීමේ කාර්යය සඳහා දරන ලද යම් වියදම් ඒ සභාව විසින් යෝජනා සම්මතයක් මගින් අත් හැරිය හැකි ය ; තව ද එවැනි යම් යෝජනා සම්මතයක් සම්මත කරනු ලැබූ යම් අවස්ථාවක දී (1) වන උපවගන්තිය යටතේ බලපත්‍රයක් නිකුත් නොකළ යුතු අතර, නිකුත් කරනු ලැබ ඇති එවැනි යම් බලපත්‍රයක් වේ නම් එය ආපසු කැඳවිය යුතු ය.

දැන්වීම, නියම සහ වෙනත් ලේඛන භාරදීම.

76. (1) යම් තැනැත්තකු වෙත භාරදීමට මේ පනතින් හෝ එය යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවකින් හෝ නියෝගයකින් නියමිත හෝ බලය දෙනු ලැබ ඇති සෑම දැන්වීමක්, නියමයක් හෝ වෙනත් ලේඛනයක්—

(අ) එය ඒ තැනැත්තාට භාර දීමෙන් හෝ ඒ තැනැත්තාගේ අවසන් වරට දැන සිටි පදිංචි ස්ථානයේ දී ඔහුගේ පවුලේ යම් වැඩිහිටි සාමාජිකයකුට හෝ සේවකයකුට භාර දීමෙන් ;

(ආ) එය ඒ තැනැත්තාගේ ලිපිනය ලියන ලද කවරයක බහා, ඒ තැනැත්තාගේ සාමාන්‍ය හෝ අවසන් වරට දැන සිටි පදිංචි ස්ථානයේ දී හෝ ව්‍යාපාර ස්ථානයේ දී භාර දීමෙන් ; හෝ

(ඇ) එය ඒ තැනැත්තාගේ සාමාන්‍ය හෝ අවසන් වරට දැන සිටි පදිංචි හෝ ව්‍යාපාර ස්ථානයේ ලිපිනයට ඒ තැනැත්තා අමතන ලද ලිපියක් ලියාපදිංචි තැපෑලෙන් යැවීමෙන්

භාරදිය හැකි ය :

එසේ වුව ද දේපළවල අයිතිකරුවන් ලියා පදිංචි කිරීම සඳහා සංවර්ධන සභාවක් විසින් විධිවිධාන සලස්වනු ලැබ, යම් දේපළ අයිතිකරුවකු ඊට අනුකූලව තමාගේ නම සහ ලිපිනය ලියා පදිංචි කර ඇති අවස්ථාවක, ඒ සෑම ලේඛනයක් ම එම ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යවනු ලබන ලිපියක බහා යැවීමෙන් ඒ තැනැත්තා වෙත භාර දිය යුතු ය.

(2) ලියාපදිංචි තැපෑලෙන් යවන ලද සෑම දැන්වීමක, නියමයක් හෝ වෙනත් ලේඛනයක්, ඒ ලේඛනය අඩංගු ලිපිය සාමාන්‍ය තැපැල් මාර්ගයෙන් භාර දෙනු ලැබිය හැකි වන්නේ යම් කාලයක දී ද ඒ කාලයේ දී එය භාර දෙනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතුය ; තවද ඒ භාරදීම ඔප්පු කිරීමේ දී, ලේඛනය අඩංගු ලිපිය නිසි පරිදි ලිපිනය ලියා තැපැල් කරනු ලැබූ බව ඔප්පු කිරීම ප්‍රමාණවත් වන්නේ ය.

(3) යම් ස්ථානයක අයිතිකරුට හෝ පදිංචිකරුට භාරදීමට මේ පනතින් හෝ එය යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවකින් හෝ නියෝගයකින් නියමිත හෝ බලය දෙනු ලැබ ඇති දැන්වීමක්, නියමයක් හෝ වෙනත් ලේඛනයක්, ඔහුගේ නම හෝ වෙනත් වැඩිදුර විස්තරයක් එකතු නොකොට ඒ ස්ථානයේ "අයිතිකරු" හෝ "පදිංචිකරු" යන විස්තරයෙන් පමණක් අමතා ඇත්තේ නම්, එය නිසි පරිදි ලිපිනය යොද ඇත්තාක් මෙන් සැලකිය යුතු ය.

(4) යම් ස්ථානයක අයිතිකරුට හෝ පදිංචිකරුට භාරදීමට මේ පනතින් හෝ එය යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවකින් හෝ නියෝගයකින් නියමිත හෝ බලය දෙනු ලැබ ඇති දැන්වීමක්, නියමයක් හෝ වෙනත් ලේඛනයක්, ඒ ස්ථානයේ යම් වැඩිහිටි තැනැත්තකුට එහි සත්‍ය පිටපතක් භාර දීමෙන් හෝ සාධාරණ උද්යෝගයෙන් එය භාර දිය හැකි තැනැත්තකු ඒ ස්ථානයේ නොමැති නම් ඒ ස්ථානයේ යම් ප්‍රකටව පෙනෙන ස්ථානයක ඇලවීමෙන් හෝ භාරදිය හැකි ය.

(5) සංවර්ධන සභාවකට දීමට හෝ භාරදීමට මේ පනතින් හෝ එය යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවකින් හෝ නියෝගයකින් නියමිත හෝ බලය දෙනු ලැබ ඇති දැන්වීමක්, ඉල්ලුම් පත්‍රයක් හෝ වෙනත් ලේඛනයක්, ඒ දැන්වීම, ඉල්ලුම් පත්‍රය හෝ වෙනත් ලේඛනය දිසා ලේකම්වරයාට දුනහොත්, ඉදිරිපත් කළහොත් හෝ භාර දුනහොත්, සභාවට දුන්, ඉදිරිපත් කළ හෝ භාරදුන් ලෙස සැලකිය යුතු ය.

නඩු පැවරීමට හෝ නඩුවල දී විත්ති වාචක ඉදිරිපත් කිරීමට සංවර්ධන සභාවක් විසින් යම් සභිකයකුට හෝ නිලධරයකුට බලය දිය හැකි බව.

**77.** ලඝු අධිකරණ බලය ඇති යම් අධිකරණයක් ඉදිරියේ සංවර්ධන සභාවක් වෙනුවෙන් නඩු කටයුතු පැවරීමට හෝ ඒ නඩු කටයුතුවල දී විත්ති වාචක ඉදිරිපත් කිරීමට හෝ සභාව විසින් හෝ සභාව වෙනුවෙන් හෝ සභාවට විරුද්ධව හෝ පවරන ලද යම් නඩු කටයුතුවල දී ඒ අධිකරණය ඉදිරියේ සභාව වෙනුවෙන් පෙනී සිටීමට සභාව විසින් යෝජනා සම්මතයක් මගින් යම් සභිකයකුට හෝ යම් නිලධරයකුට සාමාන්‍යයෙන් හෝ යම් විශේෂ කාරණයක් සම්බන්ධයෙන් හෝ බලය දිය හැකි ය ; තව ද එසේ බලය දෙන ලද යම් සභිකයකුට හෝ නිලධරයකුට ඒ නඩු කටයුතු පැවරීමට හෝ එහිදී විත්ති වාචක ඉදිරිපත් කිරීමට හිමිකම තිබිය යුතු අතර 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ කුමක් සඳහන්ව ඇත ද ඒ සභිකයා හෝ නිලධරයා නීතිඥවරයකු නොවුව ද ඒ නඩු කටයුතු පවත්වා ගෙන යාමට ඔහුට හිමිකම තිබිය යුතු ය.

සභාවට විරුද්ධව පවරන නඩු සීමා කිරීම.

**78.** (1) මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක හෝ නියෝගයක හෝ විධිවිධාන යටතේ කරන ලද හෝ නොකර හරින ලද යම් දෙයක් සම්බන්ධයෙන් යම් සංවර්ධන සභාවකට, එහි සභාපතිවරයාට, යම් සභිකයකුට හෝ සභාවේ හෝ සභාපතිවරයාගේ විධානය යටතේ ක්‍රියා කරන යම් තැනැත්තකුට හෝ විරුද්ධව කිසිම නඩුවක්, එම නඩුවේ නඩු නිමිත්ත සහ පැමිණිලිකරු වීමට බලාපොරොත්තු වන තැනැත්තාගේ ද, නඩුව සඳහා ඒ තැනැත්තාගේ නීතිඥවරයකු හෝ අනුයෝජිතයකු වේ නම් ඔහුගේ ද නම හා ලිපිනය සාධාරණ නියත භාවයකින් දැක්වෙන ලියවිල්ලකින් වූ දැන්වීමක් සභාවට හෝ විත්තිකරුට දීමෙන් පසු එක් මාසයක් ඉකුත්වන තුරු, පවරනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් සෑම නඩුවක් ම නඩු නිමිත්ත පැන නැගීමෙන් පසු ඊළඟට එළඹෙන අවුරුදු දෙක ඇතුළත ආරම්භ කළ යුතු අතර, ඒ කාල සීමාවෙන් පසු ආරම්භ නොකළ යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ යම් නඩුවක් පිළිබඳව දැන්වීමක් දෙනු ලැබූ යම් තැනැත්තකු නඩුව පවරනු ලැබීමට පෙර, පැමිණිලිකරුට ප්‍රමාණවත් හානිපූරණ සැලසුවහොත්, නඩුව පැවරූ විට ඒ පැමිණිලිකරු ගාස්තු අයකර නොගත යුතු අතර විත්තිකරුගේ ගාස්තු පැමිණිලිකරු විසින් ගෙවනු ලැබීමට විත්තිකරුට හිමිකම ලැබිය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ හානිපූරණ සැලසීමක් කරනු නොලැබුවහොත්, නඩුව විනිශ්චයට භාජනව ඇත්තේ යම් අධිකරණයක ද ඒ අධිකරණයේ අවසරය ඇතිව, විසඳිය යුතු කරුණු එක් කිරීමට පෙර කවර හෝ වේලාවක දී, සුදුසු යයි විත්තිකරු කල්පනා කරන මුදල් ප්‍රමාණයක් විත්තිකරු විසින් අධිකරණයට ගෙවීම නීත්‍යනුකූල වන අතර ඉන් පසු එම නඩු කටයුතු අධිකරණයට මුදල් ගෙවීමට විත්තිකරුවන්ට අවසර ඇති වෙනත් නඩුවල දී මෙන්, පවත්වා ගෙන යනු ලැබිය යුතු ය.

අපරාධ නඩු පැවරීම සීමා කිරීම.

**79.** වරද සම්බන්ධයෙන් වූ පැමිණිල්ල, ඒ වරද සිදු කිරීමෙන් පසු ඊළඟට එළඹෙන මාස හය ඇතුළත කරනු ලැබුවහොත් මිස, යම් අධිකරණයක නඩු විභාග කළ හැකි යම් වරදක් සම්බන්ධයෙන් මේ පනත හෝ එය යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක් හෝ නියෝගයක් යටතේ යම් දඩයකට හෝ දණ්ඩනයකට කිසිම තැනැත්තකු යටත් නොවිය යුතු ය.

සභාවේ සභිකයන් ආරක්ෂා කිරීම.

**80.** යම් සංවර්ධන සභාවක් විසින් යම් කාරණයක් හෝ දෙයක් කරන ලද්දේ හෝ නොකර හරින ලද්දේ හෝ සභාව විසින් යම් ගිවිසුමකට ඇතුළත් වූයේ හෝ යම් සභිකයකු විසින් හෝ වෙනත් කවර හෝ තැනැත්තකු විසින් සභාවේ විධානය යටතේ යම් දෙයක් කරන ලද්දේ හෝ නොකර හරින ලද්දේ සද්භාවයෙන් මේ පනතේ හෝ සභාවේ හෝ, සභාපතිවරයාගේ හෝ දිසා ලේකම්වරයාගේ බලතල හා කර්තව්‍යවලට අදාළ වෙනත් යම ලිඛිත නීතියක හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක හෝ නියෝගයක විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා නම්, එසේ කරන ලද හෝ නොකර හරින ලද කිසිම දෙයක් හෝ කාරණයක් නිසා හෝ එසේ ඇතුළත්වුණු ගිවිසුමක් නිසා යම් සභිකයකු හෝ වෙනත් යම් තැනැත්තකු කවර හෝ අන්දමක යම් නඩුවකට, වගකීමකට, හිමිකම් පෑමකට හෝ

ඉල්ලීමකට පෞද්ගලිකව යටත් නොවිය යුතු අතර සභාව විසින් හෝ ඉහත කී පරිදි ක්‍රියා කරන සභිකයකු හෝ වෙනත් තැනැත්තකු විසින් දරන ලද යම් වියදම් අරමුදලෙන් දැරිය යුතු හා ආපසු ගෙවිය යුතු වන්නේ ය :

එසේ වුව ද යම් සභිකයකු සභාවේ ගිණුම් විගණනයේ දී ඉඩදෙනු නොලැබිය හැකි වූ ද ඒ සභිකයා විසින් බලය දෙනු ලැබූ හෝ බලය දීමට හවුල් වූ ද යම් ගෙවීමක මුදල අධිභාර කරනු ලැබීමට යටත් වීමෙන් මේ වගන්තියේ කිසිවක් නිසා නිදහස් නොවිය යුතු ය.

81. යම් සිවිල් නඩුවක, අපරාධ නඩුවක හෝ වෙනත් නඩු කටයුත්ත ක විත්තිකරු සංවර්ධන සභාවක සභිකයකු හෝ අනුයෝජිතයකු වන්නේ නම්, ඒ සිවිල් නඩුවේ දී, අපරාධ නඩුවේ දී හෝ නඩු කටයුත්තේ දී නැතහොත් එහි ප්‍රතිඵලයක් වශයෙන් හෝ ගාස්තු, අයකිරීම්, වියදම්, අලාභ හෝ දඩ සම්බන්ධයෙන් වුව ද අන්‍යායාකාරයකින් වුව ද විත්තිකරු විසින් ගෙවිය යුතු යම් මුදලක් සම්පූර්ණයෙන් ම හෝ එහි යම් කොටසක්, යුදුසු යයි සභාව කල්පනා කරන්නේ නම් සහ ඒ සිවිල් නඩුව, අපරාධ නඩුව හෝ වෙනත් නඩු කටයුත්ත විභාග කොට නිශ්චය කරන අධිකරණය විසින් අන්‍යායාකාරයෙන් විධාන කරනතාක් ප්‍රමාණයට හැර සභාව විසින්, වෙනත් යම් බලතලවලට යටත්ව සහ ඒ බලතලවලට හානියක් නොමැතිව, අරමුදලෙන් ගෙවනු ලැබිය හැකි ය.

*විත්තිකරුගේ ගාස්තු ආදිය අරමුදලෙන් ගෙවිය හැකි බව.*

82. මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, අමාත්‍ය වරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි අනුප්‍රමාණ අනුව, සංවර්ධන සභාවක සභිකයන්ට පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු ය.

*සංවර්ධන සභාවක සභිකයන්ට පාරිශ්‍රමික ගෙවීම.*

83. සැම සභිකයකු ද සභාව විසින් හෝ සභාව වෙනුවෙන් යම් දිස්ත්‍රික් බද්දක්, කුලියක්, රේන්දයක් හෝ දිස්ත්‍රික්කයේ ඉඩම් වෙනුවෙන් හෝ ඒ සම්බන්ධයෙන් වූ යම් ගෙවීමක් එකතු කිරීම භාර දෙනු ලැබ ඇති සැම කොන්ත්‍රාත්කරුවකු හෝ අනුයෝජිතයකු ද ඒ කොන්ත්‍රාත් කරු හෝ අනුයෝජිතයා විසින් සේවයෙහි නියුක්ත කර ඇති සැම තැනැත්තකු ද දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව ද එහි කාර්ය සඳහා ද රජයේ සේවකයකු ලෙස සලකනු ලැබිය යුතු ය.

*සංවර්ධන සභාවල සභිකයන් සහ වෙනත් අය රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු බව.*

84. සැම සංවර්ධන සභාවක් ම අල්ලස් පනතේ අර්ථානුකූලව උප ලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ පනතේ විධි විධාන ඒ අනුව අර්ථනිරූපණය කරනු ලැබිය යුතු ය.

*සංවර්ධන සභාව අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු බව.*

85. මේ පනත යටතේ වූ සැම අපරාධ නඩුවක් ම මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවරනු ලැබිය යුතු අතර, ඒ සැම අපරාධ නඩුවක් ම 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ විධිවිධානවලින් පාලනය කරනු ලැබිය යුතු ය ; තව ද ඒ මහෙස්ත්‍රාත්වරයා විසින් නියම කරනු ලබන දඩය හෝ දණ්ඩනය ඒ මහෙස්ත්‍රාත්වරයාගේ සාමාන්‍ය අධිකරණ බලයේ සීමා ඉක්මවන්නේ වුව ද මේ පනතින් නැතහොත් යම් අතුරු ව්‍යවස්ථාවක් හෝ නියෝගයක් මගින් විධිවිධාන සලස්වා ඇති සම්පූර්ණ දඩය හෝ දණ්ඩනය ඒ මහෙස්ත්‍රාත්වරයා විසින් නියම කිරීම නීත්‍යානුකූල විය යුතු ය.

*අපරාධ නඩු මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පැවරිය යුතු බව.*

දඩ මුදල් යෙදවීම.

**86.** මේ පනතේ බලය ප්‍රකාර යම් දඩයක් නියම කරනු ලබන්නේ යම් මහෙස්ත්‍රාත්වරයකු විසින් ද ඒ මහෙස්ත්‍රාත්වරයා විසින්, අයකර ගත් මුදලින් දෙකෙන් එක් පංගුවකට වැඩි නොවන යම් කොටසක් යම් තොරතුරු සපයන්නකුට ප්‍රදානය කළ හැකි අතර, ඉතිරි කොටස හෝ ඔහු ඒ තොරතුරු සපයන්නාට ප්‍රදානයක් නොකරන්නේ නම් ඒ දඩයේ මුළු මුදල හෝ සංවර්ධන සභාවට ගෙවන ලෙස ආඥා කළ යුතු ය.

වාර්තා සහ ලේඛන දිසා ලේකම්වරයා භාරයේ තිබිය යුතු බව.

**87.** (1) සෑම සංවර්ධන සභාවකම වාර්තා සහ ලේඛන දිසා ලේකම් වරයා භාරයේ තිබිය යුතු අතර, ඒවා ඒ සම්බන්ධයෙන් මේ පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවලට අනුකූලව ආරක්ෂා භාරයේ තැබිය යුතු ය.

(2) දිසා ලේකම්වරයා විසින් සභාවට අයිති සියලු ඔප්පු, වාර්තා, වෙනත් පොත් සහ ලේඛන තම ආරක්ෂාව හා භාරය යටතේ තබාගත යුතු අතර ඒ සම්බන්ධයෙන් ඔහු වග කිව යුතු ය.

සංවර්ධන සභාවකට නිශ්චල සහ චංචල දේපළ පැවරිය හැකි බව.

**88.** (1) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, ජනාධිපති වරයා විසින්—

(අ) වාර්ෂික සංවර්ධන සැලැස්මේ කාර්ය සඳහා රජයේ යම් චංචල හෝ නිශ්චල දේපළක් ;

(ආ) ඒ කාර්යය හා සම්බන්ධ යම් ගිවිසුම් සහ වගකීම් සංවර්ධන සභාවක් සතු කිරීම, සංවර්ධන සභාවකට පැවරීම හෝ බැහැර කිරීම කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නියමයක් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ විට—

(අ) නියමයෙහි සඳහන් දේපළ සංවර්ධන සභාව සතුවී සංවර්ධන සභාවේ දේපළ විය යුතු ය ;

(ආ) නියමයෙහි සඳහන් ගිවිසුම් සභාවේ ගිවිසුම් වශයෙන් සැලකිය යුතු අතර පවතින සියලු අයිතිවාසිකම් සහ බැඳීම්, සභාවේ අයිතිවාසිකම් සහ බැඳීම් වශයෙන් සැලකිය යුතු ය ; තව ද

(ඇ) නියමයෙහි සඳහන් වගකීම සභාවේ වගකීම් වශයෙන් සැලකිය යුතු ය.

සංවර්ධන සභාවක් සඳහා ආණ්ඩුව විසින් ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් අත් කර ගත හැකි බව.

**89.** සංවර්ධන සභාවක කාර්යය සඳහා යම් ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් අවශ්‍ය වන අවස්ථාවක, ඒ ඉඩම හෝ ගොඩනැගිල්ල අවශ්‍ය කරනු ලබන්නේ යම් කාර්යයක් සඳහා ද ඒ කාර්යය පොදු කාර්ය යක් ලෙස සලකනු ලැබිය යුතු ය ; තව ද ඒ අනුව සභාව සඳහා ආණ්ඩුව විසින් ඉඩම් අත් කර ගැනීමේ පනත යටතේ ඒ ඉඩම හෝ ගොඩනැගිල්ල අත් කර ගනු ලැබිය හැකි ය.

මහා කොළඹ ආර්ථික කොමිෂන් සභාවේ බල ප්‍රදේශය ඇතුළත මේ පනත ක්‍රියාත්මක වීම හා එහි බලපෑම.

**90.** ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, ජනාධිපතිවරයා විසින් මේ වගන්තිය ක්‍රියාත්මක නොවිය යුතු ප්‍රදේශයක් ලෙස කලින් කල නියම කරනු ලැබූ යම් ප්‍රදේශයක් හැර, (මෙහි මින් මතු " කොමිෂන් සභාව " යනුවෙන් සඳහන් කරනු ලබන) මහා කොළඹ ආර්ථික කොමිෂන් සභාවේ බල ප්‍රදේශය තුළ, පහත දැක්වෙන විධි විධාන, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් ජනාධිපතිවරයා විසින් තීරණය කරනු ලබන යම් දිනයක සිට, බලපැවැත්විය යුතු ය :—

(අ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන මහා කොළඹ ආර්ථික කොමිෂන් සභා පනතේ 21 වන සහ 22 වන වගන්තිවල විධිවිධාන අදාළ නොවිය යුතු ය ;

(ආ) (i) ඉහත කී පනතේ 22 වන වගන්තිය ක්‍රියාත්මක වීමේ හේතුව නිසා විසුරුවා හරිනු ලැබූ ලෙස සලකන ලද සෑම මහ නගර සභාවක් ම හෝ නගර සභාවක් ම වෙනුවට, අවස්ථාවෝචිත පරිදි, ඒ මහ නගර සභාවට හෝ නගර සභාවට අනුරූපී මහ නගර සභාවක් හෝ නගර සභාවක් තිබිය යුතු අතර, ඒ අනුව, ඒ සභාවලට මහ නගර සභා ආඥාපනතේ හෝ නගර සභා ආඥාපනතේ විධිවිධාන අදාළ විය යුතු ය ;

(ii) කොමිෂන් සභාවේ බල ප්‍රදේශයේ යම් කොටසක්, ඉහත කී පනතේ 22 වන වගන්තිය ක්‍රියාත්මක වීමේ හේතුව නිසා විසුරුවා හරිනු නොලැබූ ලෙස සලකන ලද මහ නගර සභා ප්‍රදේශයක කොටසකින් හෝ නගර සභා ප්‍රදේශයක කොටසකින් සංයුක්ත වන අවස්ථාවක, කොමිෂන් සභාවේ බල ප්‍රදේශයේ ඒ කොටස, ඉහත කී පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ම වූ දිනයෙහි, ඒ කොටස අයත්ව තිබුණේ යම් මහ නගර සභාවක ප්‍රදේශයකට ද නැතහොත් යම් නගර සභාවක ප්‍රදේශයකට ද ඒ මහ නගර සභා ප්‍රදේශයේ හෝ ඒ නගර සභා ප්‍රදේශයේ කොටසක් ලෙස සලකනු ලැබිය යුතු ය ;

(ඇ) කොමිෂන් සභාවේ බල ප්‍රදේශය ඇතුළත වූ සෑම පරිපාලන දිස්ත්‍රික්කයක් සඳහා සංස්ථාපනය කරන ලද සංවර්ධන සභාව විසින්—

(i) ඉහත කී පනතේ 22 වන වගන්තිය ක්‍රියාත්මක වීමට පෙරාතුව නගරයක්ව පැවති යම් ප්‍රදේශයක් තුළ, සුළු නගර සභාවක බලතල, කාර්ය හා කර්තව්‍ය ; සහ

(ii) ඉහත කී පනතේ 22 වන වගන්තිය ක්‍රියාත්මක වීමට පෙරාතුව ගම් ප්‍රදේශයක්ව පැවති යම් ප්‍රදේශයක් තුළ, ගම් සභාවක බලතල, කාර්ය හා කර්තව්‍ය

ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කළ යුතු ය ;

(ඈ) යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන්ව ඇත ද (ආ) ඡේදයෙහි සඳහන් සෑම මහ නගර සභාවක හෝ නගර සභාවක සභිකයන් තෝරා පත්කර ගැනීමේ කාර්යය සඳහා, තත් කාර්යය සම්බන්ධයෙන් තත් කාලයේ අදාළ වන යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනුකූලව, ඡන්ද විමසීමක් පැවැත්විය යුතු බවට අමාත්‍යවරයා සෑහීමකට පත්වන තුරු, අවස්ථාවෝචිත පරිදි,

ඒ මහ නගර සභාවේ හෝ නගර සභාවේ කටයුතු පරිපාලනය කිරීම සඳහා, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, අමාත්‍යවරයා විසින් ඒ මහ නගර සභාව හෝ නගර සභාව සම්බන්ධයෙන් විශේෂ කොමසාරිස්වරයකු පත් කරනු ලැබිය හැකි ය ;

(ඉ) (ආ) ඡේදයේ සඳහන් සෑම මහ නගර සභාවක් ම සහ නගර සභාවක් ම, කොමිෂන් සභාවේ බල ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ මහ නගර සභා ප්‍රදේශය හෝ නගර සභා ප්‍රදේශය සම්බන්ධයෙන්, කොමිෂන් සභාවේ අනුප්‍රාප්තිකයා විය යුතු ය ;

(ඊ) ඉහත කී පනතේ 22 වන වගන්තියේ (3) වන උපවගන්තියෙහි සඳහන් වූ ද මේ වගන්තිය යටතේ තීරණය කරනු ලැබිය යුතු දිනයට පෙරාතුව ම වූ දිනයෙහි යම් ප්‍රදේශයක් තුළ බල පැවැත් වූ ද සියලු අතුරු ව්‍යවස්ථා, ඒවා අදාළ වූ ප්‍රදේශ තුළ තවදුරටත් බලපැවැත්විය යුතු අතර, ඒ අතුරු ව්‍යවස්ථා ඒ ප්‍රදේශයේ, අවස්ථාවෝචිත පරිදි, මහ නගර සභාව, නගර සභාව හෝ සංවර්ධන සභාව විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථා ලෙස සලකනු ලැබිය යුතු ය ;

(උ) (i) මේ වගන්තිය යටතේ තීරණය කරනු ලැබිය යුතු දිනයට ඉහතින් ම වූ දිනයෙහි, පළාත් පාලන සේවයෙහි සාමාජිකයකුව සිටි කොමිෂන් සභාවේ සෑම සේවා නියුක්තයකු ම, තවදුරටත් ඒ සේවයේ සාමාජිකයකුව සිටිය යුතු ය ;

(ii) පළාත් පාලන සේවයේ සාමාජිකයකුව නොසිටියා වූ ද, ඉහත කී පනතේ 22 වන වගන්තිය ක්‍රියාත්මකවීමේ හේතුව නිසා කොමිෂන් සභාවේ සේවා නියුක්තයකු වූ ද මේ වගන්තිය යටතේ තීරණය කරනු ලැබිය යුතු දිනයට පෙරාතුව ම වූ දිනයෙහි කොමිෂන් සභාවේ සේවා නියුක්තයකු වූ ද, කොමිෂන් සභාවේ සෑම සේවා නියුක්තයකු ම, ඉහත කී පනතේ 22 වන වගන්තිය යටතේ විසුරුවා හරිනු ලැබූ මහ නගර සභා හෝ නගර සභා වෙනුවට සංස්ථාපනය කරන ලද, අවස්ථාවෝචිත පරිදි, මහ නගර සභාවේ හෝ නගර සභාවේ සේවා නියුක්තයකු ලෙස සලකනු ලැබිය යුතු ය :

එසේ වුව ද ඔවුන් ඉහත කී පනත යටතේ විසුරුවා හරින ලද සුළු නගර සභාවක හෝ ගම් සභාවක සේවා නියුක්තයන්ව සිටි අවස්ථාවක, ඒ සුළු නගර සභාව හෝ ගම් සභාව සංස්ථාපනය කරනු ලැබුවේ යම් නගරයක් හෝ ගමක් සඳහා ද ඒ නගරය හෝ ගම පිහිටි ප්‍රදේශය සඳහා සංස්ථාපනය කරන ලද සංවර්ධන සභාවේ සේවා නියුක්තයන් ලෙස ඔවුන් සලකනු ලැබිය යුතු ය ;

(ඌ) ඉහත කී පනතේ 21 වන සහ 22 වන වගන්ති මගින් පවරන ලද බලතල ක්‍රියාත්මක කිරීම සහ කර්තව්‍ය හා කාර්ය ඉටුකිරීම පිළිබඳව කොමිෂන් සභාව විසින් සේවයෙහි නියුක්ත කරනු ලැබුවා වූ ද මේ වගන්තිය යටතේ තීරණය කරනු ලැබිය යුතු දිනයට පෙරාතුව ම වූ දිනයෙහි එසේ සේවයෙහි නියුක්ත කරනු ලැබුවා වූ ද, (උ) ඡේදයෙහි සඳහන් සේවා නියුක්තයකු

නොවන්නා වූ ද කොමිෂන් සභාවේ සෑම සේවා නියුක්තයකු ම, අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන පරිදි, (ආ) ඡේදයෙහි සඳහන් මහ නගර සභාවක හෝ නගර සභාවක හෝ (ඇ) ඡේදයෙහි සඳහන් සංවර්ධන සභාවක හෝ සේවා නියුක්තයකු ලෙස සලකනු ලැබිය යුතු ය. ඒ තීරණය කිරීම අවසානාත්මක විය යුතු ය ;

(ඒ) (උ) සහ (ඌ) ඡේදවල සඳහන් සෑම සේවා නියුක්තයකු ම, මේ වගන්තිය යටතේ තීරණය කරනු ලැබිය යුතු දිනයට පෙරාතුව ම වූ දිනයෙහි ඒ සේවා නියුක්තයා විසින් භුක්ති විඳින ලද නියම හා කොන්දේසිවලට වඩා අඩු වාසිසහගත නොවන නියම හා කොන්දේසි මත සේවයෙහි නියුක්ත කරනු ලැබිය යුතු ය ;

(ඓ) (i) ඉහත කී පනතේ 22 වන වගන්තිය යටතේ කොමිෂන් සභාව වෙත සතු කරන ලද, මහ නගර සභාවක හෝ නගර සභාවක සියලු වත්කම් හා බැරකම් ඒ විසුරුවා හරින ලද සභා වෙනුවට සංස්ථාපනය කරන ලද සභාවල වත්කම් හා බැරකම් ලෙස සලකනු ලැබිය යුතු ය ;

(ii) ඉහත කී පනතේ 22 වන වගන්තිය යටතේ කොමිෂන් සභාව වෙත සතු කරන ලද, සුළු නගර සභාවක හෝ ගම් සභාවක සියලු වත්කම් හා බැරකම්, ඒ සුළු නගර සභාව හෝ ගම් සභාව වෙනුවට සංස්ථාපනය කරන ලද සංවර්ධන සභාවේ වත්කම් හා බැරකම් ලෙස සලකනු ලැබිය යුතු ය ;

(ඔ) ජනාධිපතිවරයා විසින් මේ වගන්තිය ක්‍රියාත්මක නොවිය යුතු ප්‍රදේශයක් ලෙස නියම කරන ලද සෑම ප්‍රදේශයකට ම, ඉහත කී පනතේ 21 වන සහ 22 වන වගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

*ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන පනත සංශෝධනය කිරීම.*

**91.** ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන මහා කොළඹ ආර්ථික කොමිෂන් සභා පනතේ 22 වන වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" (2අ) කොමිෂන් සභාවේ බලප්‍රදේශය ඇතුළත සම්පූර්ණ වශයෙන් හෝ කොටසක් වශයෙන් තම පරිපාලන සීමා පිහිටියා වූ, මහ නගර සභාවක්, නගර සභාවක්, සුළු නගර සභාවක් හෝ ගම් සභාවක් විසුරුවා හරිනු ලැබ, ඒ සභාවේ කටයුතු පරිපාලනය කිරීම පිණිස නිලධරයකු පත් කරනු ලැබ ඇති අවස්ථාවක, කොමිෂන් සභාව, අවස්ථාවෝචිත පරිදි, ඒ සම්පූර්ණ පරිපාලන ප්‍රදේශයේ හෝ එහි කොටසේ හෝ කටයුතු පරිපාලනය කරන ඒ නිලධරයාගේ අනුප්‍රාප්තිකයා ලෙස සලකනු ලැබිය යුතු ය. ".

*91 වන වගන්තිය අතීතයටත් බල පැවැත්විය යුතු බව.*

**92.** 91 වන වගන්තියෙන් ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන මහා කොළඹ ආර්ථික කොමිෂන් සභා පනතට කරන ලද සංශෝධනය, ඒ පනත ක්‍රියාත්මක වූ දිනයෙහි ක්‍රියාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

" පරිපාලන දිස්ත්‍රික්කය " යන්නෙහි අර්ථය.

**93.** මේ පනතේ සහ පරිපාලන දිස්ත්‍රික්ක පනතේ කාර්ය සඳහා, " පරිපාලන දිස්ත්‍රික්කය " යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පළමු වන උපලේඛනයෙහි දක්වා ඇති එක් එක් පරිපාලන දිස්ත්‍රික්කය අදහස් වන අතර ඒ පරිපාලන දිස්ත්‍රික්කවල සීමා, මේ පනතේ දෙවන උපලේඛන යෙහි දක්වා ඇති යුළු වශයෙන් වූ වෙනස් කිරීම්වලට යටත් ව, ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව ආරම්භයේ දී පරිපාලන දිස්ත්‍රික්ක පනත මගින් හෝ ඉහත කී පනතේ 3 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මතයක් මගින් නියම කර ඇති සීමා ලෙස සලකනු ලැබිය යුතු ය.

දුෂ්කරතා ඉවත් කිරීම.

**94.** යම් අනපේක්ෂිත හෝ විශේෂ අවස්ථාවක් සඳහා හෝ සංවර්ධන සභාවක කටයුතු පරිපාලනය සම්බන්ධයෙන් පැන නැගිය හැකි වූ ද මේ පනත මගින් විධිවිධාන හෝ ඵලදායී විධිවිධාන සලස්වා නොමැති වූ ද යම් ප්‍රශ්නයක් හෝ කාරණයක් තීරණය කිරීම හෝ අනුකූලනය සඳහා විධිවිධාන සලස්වමින් ජනාධිපතිවරයා විසින් පරිපාලනමය ස්වභාවයේ නියමයන් කිරීම නිත්‍යානුකූල වන්නේ ය.

අර්ථ නිරූපණය.

**95.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

" උචිත අමාත්‍යවරයා " යන්න, යම් කාරණයක් හෝ දෙයක් සම්බන්ධයෙන් යෙදෙන විට, ඒ කාරණය හෝ දෙය හා සම්බන්ධ විෂයය හෝ කාර්යය වෙන් කර දෙනු ලැබ සිටින අමාත්‍යවරයා ඉන් අදහස් වේ ;

" දිසා අමාත්‍යවරයා " යන්න, යම් සංවර්ධන සභාවක් සම්බන්ධයෙන් යෙදෙන විට, සංවර්ධන සභාවක් සංස්ථාපනය කරනු ලැබ ඇත්තේ යම් පරිපාලන දිස්ත්‍රික්කයක් සඳහා ද ඒ පරිපාලන දිස්ත්‍රික්කය හා සම්බන්ධ විෂයය හා කර්තව්‍යය වෙන් කර දෙනු ලැබ සිටින අමාත්‍යවරයා ඉන් අදහස් වේ ;

" දිසා ලේකම්වරයා " යන්නෙන්, 48 වන වගන්තිය යටතේ පරිපාලන දිස්ත්‍රික්කයක් සඳහා පත් කරන ලද දිසා ලේකම්වරයා අදහස් වේ ;

" මැතිවරණ කොට්ඨාසය " යන්නෙහි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය ;

" තෝරා පත්කරගන්නා ලද සභිකයා " යන්නෙන්, 2 වන වගන්තියේ සඳහන් සභිකයකු අදහස් වන අතර එය සභාවක් සම්බන්ධයෙන් යෙදෙන විට ඒ සභාවේ තෝරා පත් කර ගන්නා ලද සභිකයකු ඉන් අදහස් වේ;

"පළාත් පාලන ආයතනය" යන්නෙන්, යම් මහ නගර සභාවක් හෝ නගර සභාවක් අදහස් වේ ;

"නියමිත" යන්නෙන්, අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග මගින් නියමිත බව අදහස් වේ ; තව ද

"ජනාධිපතිවරයා" යන්නෙන්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිවරයා අදහස් වේ.

## පළමුවන උපලේඛනය

[17 වන හා 35 වන වගන්ති]

### විෂයයන්

(i) ගොවිජන සේවා
(ii) කෘෂිකර්මය
(iii) සත්ව පාලනය
(iv) සමුපකාර සංවර්ධනය
(v) සංස්කෘතික කටයුතු
(vi) අධ්‍යාපනය
(vii) රැකිරක්ෂා
(viii) ධීවර කර්මාන්තය
(ix) ආහාර
(x) සෞඛ්‍ය සේවා
(xi) නිවාස
(xii) (අන්තර් දිස්ත්‍රික්ක ස්වභාවයේ නොවන) වාරිමාර්ග කටයුතු
(xiii) ඉඩම් පරිහරණය සහ ඉඩම් නිරවුල් කිරීම
(xiv) ග්‍රාම සංවර්ධනය
(xv) කුඩා හා මධ්‍යම පරිමාණ කර්මාන්ත.

## දෙවන උපලේඛනය [93 වන වගන්තිය]

1. 1978 සැප්තැම්බර් මස 07 වන දින සිට, ගම්පහ සහ මුලතිව් යන අලුත් දිස්ත්‍රික්ක ඇති කිරීම සහ ඊට ආනුෂංගික වශයෙන්, කොළඹ, යාපනය, මන්නාරම සහ වවුනියාව යන දිස්ත්‍රික්කවල මායිම් වෙනස් කිරීම.—**1978 ඔක්තෝබර් මස 20 වන දින දරන ගැසට් පත්‍රය.**

2. 1979 ජූනි මස 29 වන දින සිට, අංක 127 දරන පත්බේරිය සහ අංක 126 දරන මහර ග්‍රාම සේවා නිලධාරි කොට්ඨාශ, කෑගල්ල දිස්ත්‍රික්කයෙන් රත්නපුර දිස්ත්‍රික්කයට මාරු කිරීම.—**1979 ජූලි මස 20 වන දින සහ 1979 අගෝස්තු මස 24 වන දින දරන ගැසට් පත්‍ර.**